# ලුම්බිණියේ සිට කුසිනාරාවට: උත්තම බුදු උපත

## (පළමු කාණ්ඩය)



# ලුම්බිණියේ සිට කුසිනාරාවට: උත්තම බුදු උපත
# (පළමු කාණ්ඩය)

# ප්‍රකාශනය සහ හිමිකම් සටහන

**නොමිලේ බෙදා හැරීම සඳහා පමණි.**
මෙම සලකා බැලීම සහ ධර්ම දානය සම්පූර්ණයෙන්ම නොමිලේ බෙදා හැරීම සඳහා පමණක් වෙන් කර ඇත. මෙහි අන්තර්ගතය වාණිජමය අරමුණු සඳහා භාවිත කිරීම සපුරා තහනම් වේ. මෙම ග්‍රන්ථයේ අන්තර්ගතය සඳහා කිසිදු ප්‍රකාශන හිමිකමක (Copyright) සීමාවක් නොමැත. ලෝකවාසී සැමගේ ප්‍රඥාව සහ දහම් අවබෝධය පිණිස, වාණිජමය නොවන අරමුණු සඳහා මෙම කරුණු නැවත මුද්‍රණය කිරීමට, උපුටා ගැනීමට, සේයා පිටපත් කිරීමට හෝ ඕනෑම මාධ්‍යයකින් ප්‍රතිනිෂ්පාදනය කර බෙදා හැරීමට පූර්ණ අවසර ඇත.

ග්‍රන්ථ විස්තරය

- **කෘතියේ නම: ලුම්බිණියේ සිට කුසිනාරාවට - ගෞතම බුදුන්වහන්සේගේ අසිරිමත් ධම්ම චාරිකාව: පළමු කාණ්ඩය: උත්තම බුදු උපත**
- **සංස්කරණය:** උපාසිකා සුධම්මා
- **ප්‍රකාශන කාලය:** 2026 අසිරිමත් වෙසක් (මැයි) මස
- **ප්‍රකාශන ස්ථානය:** බන්ඩනූන්, නිව් සවුත් වේල්ස්, ඕස්ට්‍රේලියාව
- **විද්‍යුත් ලිපිනය:** sudaine@gmail.com (නිවැරදි කිරීම් හෝ නිරීක්ෂණ සඳහා)

**මුල් පිටුවේ පිංතූරය:** බුදුන් වහන්සේ—මහා ශාස්තෘන් වහන්සේ, නිර්භය, ප්‍රඥාවන්ත ගැල් නායකයා ලෙසින් තමන් වහන්සේගේ ශ්‍රාවක පිරිස ඇතුළු දමනය කළ හැකි ලෝක සත්වයාට සසර මහා දුක් කතරෙන් එතර වීමට මග පෙන්වා වදාළසේක.

**"සියලු දාන අතුරින් දහම් දානය උතුම්වේ,**
**දහම් රසය සියලු රසයන්ට වඩා අග්‍රවේ,**
**දහමෙන් ලබන සතුට උතුම්ම සතුට වේ."**

**(ධම්මපදය: ගාථාව 354)**

## පිළිගැන්වීම

අපගේ ගෞතම බුදුන් වහන්සේ මහා කරුණාවෙන් වදාළ උතුම් දහම අනුගමනය කරණ අප, ඒ උතුම් මග ගමන් කරමින් නිරතුරුවම ලබන අපමණ සුවයට කෘතඥතාව පළ කිරීම පිණිස මෙම ප්‍රකාශනය සකස් කරන ලදී. මේ ප්‍රයත්නය අපගේ දෝතින් මහා සාගරයේ ජලය කුඩා බඳුනකට එකතු කිරීමට දරන වෑයමක් බඳුය. මේ අවස්ථාවේ දී අපට සිහිපත්වන්නේ විදාගම මෛත්‍රිය මහා තෙරුන් වහන්සේ බැතියෙන් සකස් කළ, 'බුදුගුණාලංකාරය' කෘතියේ මුලින්ම දක්වා ඇති මේ කවි පෙළයි:

"පරසතු මලින් පුද- ලද මුණිසඳුට දිය නද,
වනපස මලින් පුද - කළැයි පවසනු කවර වරදද?"

ඒ නිහතමානී වදන් සිහිපත් කරමින්, බුදුගුණ නමැති මහා සාගරයේ දිය බින්දුවක් වැනි අපගේ මේ සැකසීම, වනයේ පිපුණ අහිංසක වන මලක් ලෙසින් අමා මෑණියන්වූ අපගේ බුදුන් වහන්සේගේ රන්වන් දෙපාමුල පුජා කරමි, පුජාම වේවා!

"සෙත්සිරි දෙනමහ ගුණ මුහුදානන්,
සත්හට වන බව දුකට වෙදානන්
තිත් ගනඳුර දුරුලන මුණිදානන්,
සිත් සතොසින් නමදිමි මුණිදානන්"

(ලෝවැඩ සඟරාව: පුජ්‍ය විදාගම මෛත්‍රිය හිමි)

උපාසිකා සුධම්මා
2026 අසිරිමත් වෙසක් (මැයි) මස,
බන්ඩනූන්, නිව් සවුත් වේල්ස්, ඕස්ට්‍රේලියාව.

# කෘතඥතාව සහ උපහාරය

ශාන්ති වන ආරාමයේ අති පුජනිය භික්ෂුණී සංඝයා වහන්සේලාගේ ශාස්ත්‍රීය මග පෙන්වීම සහ දයාවන්ත සහයෝගය වෙනුවෙන් අපි අපගේ ගෞරවනීය කෘතඥතාවය පුද කරමු. අපගේ ධර්ම මිතුරු කැළට: මෙම ගමනේදී ඔබගේ ස්ථිර දිරිගැන්වීම  සහ කල්‍යාණ මිත්‍රත්වයට ස්තුතියි.

තාක්ෂණික සහ තොරතුරු සහාය: මෘදුකාංග, පරිවර්තන මෙවලම් සහ පර්යේෂණ දත්ත සැපයූ Microsoft, Google, DeepL, ChatGPT සහ විද්‍යුත් විද්‍යා ක්ෂේත්‍රයේ දායකත්වයන්ට අපි ණයගැතිවෙමු. එසේම මෙම ව්‍යාපෘතිය පොහොසත් කළ තොරතුරු සහ නිදර්ශන සඳහා අන්තර්ජාලය ඔස්සේ නොමිලේ ප්‍රවේශය ලබා දුන් බොහෝ මාර්ගගත වේදිකා සහ විවිධ ඩිජිටල් ලේඛනාගාරවලට, වෙබ් අඩවියන්ට, විකිපීඩියා, සහ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ප්‍රකාශනයන්ට අපි බෙහෙවින් කෘතඥ වෙමු.

මෙම කෘතිය සඳහා මූලික මූලාශ්‍ර ලෙස අප විසින් භාවිත කරන ලද, භික්ඛු බෝධි, භික්ඛු බ්‍රහ්මාලි සහ භික්ඛු සුජාතෝ යන පූජනිය සංඝයා වහන්සේලා සහ කැපවූ බෞද්ධ විද්වතෙක් වූ   මොරිස් වෝල්ෂ් (Maurice Walshe) මහතා විසින් සිදු කරන ලද විශිෂ්ට ත්‍රිපිටක ඉංග්‍රීසි පරිවර්තන, අපි ඉමහත් ගෞරවයෙන් හා කෘතඥතාපූර්වකව අගය කරමු.

# හැඳින්වීම

**"ලුම්බිණියේ සිට කුසිනාරාවට - ගෞතම බුදුන් වහන්සේගේ අසිරිමත් ධම්ම චාරිකාව"** යන මාතෘකාව යටතේ සකස් කළ අපගේ මෙම සංස්කරණයේ මූලික අරමුණ වන්නේ, ලුම්බිණි සල් උයනේදී රජ කුමරෙකු ලෙසින් උපත ලබා, කුසිනාරා නුවර සල් රුක් සෙවණේදී මහා පරිනිර්වාණයට පත් වූ අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ වසර හතළිස් පහක් පුරා විහිදුණු අසමසම ජීවන පුවතත්, මහා කරුණාවෙන් සිදු කළ දහම් චාරිකාවත් ලෝකවාසී පාඨකයන් වෙත පිදීමයි. ත්‍රිපිටක මූලාශ්‍ර සහ බෞද්ධ සම්ප්‍රදාය පාදක කරගනිමින්, අවශ්‍ය ස්ථානයන්හිදී ඉතිහාසමය හා පුරාවිද්‍යාත්මක තොරතුරුද පෙරදැරි කරගනිමින්, උන්වහන්සේගේ අසාමාන්‍ය මෙහෙවර සහ ජීවිතයේ ප්‍රධාන සිදුවීම් වර්තමාන ලෝකය හා යා කරමින් සරලව ඉදිරිපත් කිරීමට මෙහිදී උත්සාහ කර ඇත.

මෙම ග්‍රන්ථ මාලාව කාණ්ඩ කිහිපයකින් පළ කිරීමට නියමිතය. ඒ සෑම කොටසකින්ම බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් විස්තර කෙරේ. එනම්, ශාක්‍ය ජනපදයේ ලුම්බිණි ගම්මානයේ සිදුහත් කුමරු ලෙස උපත ලැබීම, රාජකීය සැප සම්පත් අත්හැර සත්‍යය සොයා කපිලවස්තු නුවරින් නික්ම යාම, උරුවෙල් දනව්වේදී දුෂ්කර ක්‍රියා කිරීම, මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ සම්මා සම්බෝධිය සාක්ෂාත් කරගැනීම සහ එතැන් පටන් කුසිනාරාවේ මල්ල රජුන්ගේ උපවත්තන සල් උයනේදී සිදුවූ මහා පරිනිබ්බානය දක්වා වසර හතළිස් පහක් පුරා ලෝක සත්ත්වයාගේ හිතසුව පිණිස ගම් නියම්ගම් සැරිසරමින් සිදු කළ උත්තම දහම් මෙහෙවර එහි සැකෙවින් ඇතුළත් වේ.

එදා අතීතයේ දඹදිව, දූවිලි පිරි මාවත් ඔස්සේ උතුම් සිරිපා තබමින් බුදුරජාණන් වහන්සේ රජවරුන්, ප්‍රභූන්, සමාජයෙන් කොන් වූවන්, දාර්ශනිකයන් මෙන්ම සාමාන්‍ය ගොවීන් හමු වූ අයුරුත්; **"දුක කෙළවර කිරීම සැමටම සාධාරණ වූවකි"** යන සරල වුවත් ගැඹුරු පණිවිඩය තුළින් උන්වහන්සේ ඔවුන්ගේ ජීවිත සුවපත් කළ අයුරුත් මේ කෘතියේ පිටු පෙරළීමේදී ඔබට දැකගත හැකි වනු ඇත. මෙම පිටු අතරින් ඔබ දකින්නේ ඓතිහාසික අසිරිමත් ජීවිතයක පූජනීය සන්ධිස්ථානයන්ය; දශක හතරකට අධික කාලයක් පුරා වෙහෙස නොබලා බෙදා දුන් ප්‍රඥාව, ඉවසීම, තර්කානුකූල බව සහ මහා මෛත් සිත පිළිබඳ සදාකාලික ආදර්ශයන්ය.

මෙය හුදෙක් බුදුන් වහන්සේගේ චරිතාපදානයක් පමණක් නොවේ— අර්ථවත් සහ සාමකාමී ජීවිතයක් අපේක්ෂා කරන ඕනෑම අයෙකුට මඟ පෙන්වන අගනා ආධ්‍යාත්මික උපදේශකයෙකි. අවිද්‍යා අඳුරෙන් මිදී විද්‍යා ආලෝකය මහා වීර්යයෙන් හා ප්‍රඥාවෙන් උදා කරගත් උන්වහන්සේගේ අසිරිමත් පිබිදීම, අසීමිත මිනිස් ශක්තිය පෙන්වන බලවත් සාක්ෂියකි. බුදුරජාණන් වහන්සේ යනු ඉතිහාසයේ පහළ වූ අසිරිමත් ආලෝකයයි. උන්වහන්සේ පෙන්වා දුන් ඒ උතුම් මාවත ඔස්සේ අදටත් අපට ගමන් කළ හැකි බව මෙම කෘතිය සිහිපත් කරයි.

මෙම ග්‍රන්ථ මාලාවේ පළමු කාණ්ඩය වන **"ලුම්බිණියේ සිට කුසිනාරාවට: උත්තම බුදු උපත"** මෙසේ ඔබ වෙත ඉමහත් සැදැහැ සිතින් පිළිගන්වමු. මෙහි දෙවන කාණ්ඩය: **බුදු උපත සිදුවූ පූජනීය භූමිය"** ලෙසින් ඉදිරිපත් කිරීමට නියමිතය.

බුදුරජාණන් වහන්සේගේ අසිරිමත් බව දැක්වෙන මෙම කෘතිය කියවා ඔබගේ හදවත සැදැහැයෙන් ඔකඳ වේ නම්, එය අපගේ පරම ලාභයයි!

*ගෝතම මුනිඳු අපගේ- ඉසිපතන වන ගොමුවේ,*
*උතුම් දහම්සක කරකවා - දෙව්මිනිසුන් හමුවේ,*
*සතළිස් පස් වසරක්- අමා දහම බෙදමින්,*
*දුකින් වෙළුන ලෝකයාට- සහනය ගෙනදෙමින්,*
*දුවිලි පිරුන මං මාවත්හි- සැරිසැරුවා මහා කරුණාවෙන්.*

*මැදි යොවුන් වියේ සිට- මහළුව දුබලවූ කය දරමින්,*
*දිරාගිය කරත්තය- රැහැන් පටියෙන් සවිමත් කරණ ලෙසින්,*
*අව් වැසි නොතකා ශීත කඳු ඔස්සේ - වේලි දැවී ගිය බිම් හරහා,*
*අවිදු අඳුරෙන් වැසුන මින්සුන්හට- දහම් ආලෝකය විහිදුවා,*
*කුසිනාරවේ සල් උයන වෙත -*
*අවසන් පියවර තැබුවා අපමණ දයාවෙන්.*

**ශ්‍රී සද්ධර්ම ආලෝකය සදාකල් බැබලේවා!**
**ඔබ සැමට අමා මහ නිවන් සුවය අත්වේවා!**



**බෝසතුන්, මනරම් ලුම්බිණියේ උපත ලබා උතුම් මව් තුමිය වූ මහාමයා දේවිය ගේ තුරුළේ වැඩසිටීම  සහ සක්දෙවිඳු ඇතුළු දේව පිරිස ප්‍රීති ඝෝෂා  පැවැත්වීම.**

# පටුන

පළමු කාණ්ඩය : උත්තම බුදු උපත ........................................ 3

1: බුදුඋපත අති දූර්ලභ සිදුවීමකි ........................................ 3

2: අතීතයේ පහළවූ බුදුවරුන් වහන්සේලා ........................................ 5

3: අනාගතයේ දී පහළවන බුදුන් වහන්සේ ........................................ 7

4: කල්පයක දිග ........................................ 8

5: බුදු උපත නිසා ලෝකයට ඇතිවූ සෙත ........................................ 10

6: බුදු උපත නිසා නිවන් දොරටු විවෘත වේ ........................................ 10

7: බුදු උපත නිසා ප්‍රඥා ආලෝකය පහළවේ ........................................ 12

8: බුදු උපතෙන් දෙවියන්ට උදාවූ සෙත ........................................ 12

9: බෝසතුන් තුසිත දෙව්ලොව වැඩසිටීම ........................................ 14

9.1: දේව ආරාධනාව ........................................ 14

9.2: පස්මහා බැලුම් ........................................ 15

10: බෝසතුන්  මව්කුස පිළිසිඳ ගැනීම ........................................ 16

11: බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් අවස්ථාවේදී සිදුවූ අසිරිමත් ලක්ෂණ.. 16

12: මහමායා දේවිය දුටු සිහිනය ........................................ 17

13: බෝසතුන් ගේ උතුම් උපත පිලිබඳ විස්තර ........................................ 18

14: මහාමායා දේවිය ලුම්බිණි උයනට පැමිණීම සහ බෝසතුන්ගේ උපත 23

15 : බෝසත් උපතේ දී සිදුවූ අපූර්ව හා අසිරිමත් සිදුවීම් ........................................ 25

16: බෝසතුන්ගේ  සත් පියවර සහ සිංහ නාදය ........................................ 26

( ........................................ 27

17. බුදු උපතේ අසිරිය ........................................ 27

1 කාණ්ඩය: අවසාන සටහන් ........................................ 29

# පළමු කාණ්ඩය : උත්තම බුදු උපත

**'ලුම්බිණියේ සිට කුසිනාරාවට'** යන සංස්කරණයේ මේ පළමු කාණ්ඩය කැප කර ඇත්තේ අපගේ ගෞතම බුදුන් වහන්සේ ගේ [1] උත්තම **උපත** පිළිබඳවය. බුදු උපතේ අසිරිය විස්තරය ත්‍රිපිටක පාඨ [2] මූලික කරගෙන ගොඩනගන ලද අතර, අවශ්‍ය ස්ථානවල බෞද්ධ සම්ප්‍රදාය, ඉතිහාසය හා පුරාවිද්‍යාත්මක සක්ෂි ද උපයෝගී කරගෙන කරුණු පැහැදිලි කර ඇත.[3]

## 1: බුදුඋපත අති දුර්ලභ සිදුවීමකි

බුදුන් වහන්සේ [4] මෙලොව පහළවීම අසිරිමත් හා අතිශය දුර්ලභ සිදුවීමකි. එය සසරින් නිදහස්වීමට බලා සිටින අසංඛ්‍ය ලෝක සත්වයන්ට විමුක්ති ආලෝකය උදා කළ, ලෝක ඉතිහාසයේ අතිශය විශේෂ අවස්ථාවකි. බුදුන් වහන්සේ මෙලොව පහළ වීම අහඹු සිදුවිමක් නොවේ. එය දීර්ඝ සසර ගමනකින් පසු, බෝසතාණන් වහන්සේ [5] විසින් සම්පූර්ණ කරණ ලද උතුම් පාරමිතාවන්ගේ [6] අවසාන ඵලයයි.

එබැවින් බුදු උපත යනු උත්තරිතර පුද්ගලයෙක් මෙලොව පහළවීම පමණක් නොවේ; ලෝක සත්වයන්ට සසර දුකින් මිදීමේ [7] දොරටුව විවෘතකර දෙන භාග්‍යවන්ත අවස්ථාවකි. බුදුඋපතේ දුර්ලභ බව ත්‍රිපිටකය මෙසේ පෙන්වා ඇත.

**ධම්මපදයට අනුව :** [8]

**"මිනිස් උපත දුර්ලභය; මිනිස් ජීවිතය දුර්ලභය, සත්‍ය ධර්මය ඇසීම දුර්ලභය; බුදුවරුන්ගේ උපත දුර්ලභය."**

*("දුල්ලභං මනුස්සත්තං- දුල්ලභං මච්චාන ජීවිතං;දුල්ලභං සද්ධම්මස්ස සවනං- දුල්ලභෝ බුද්ධානං උප්පාදො.")*

මෙම ගාථාව පැහැදිලිවම පෙන්නා දෙන්නේ බුදුඋපත, ලෝකයාට අතිශය විරල අවස්ථාවක් බවය.

**අංගුත්තර නිකායේ,** පාතුභාව සූත්‍රය මෙසේ දක්වා ඇත: [9]

**“තථාගත, අරහත්, සම්මාසම්බුද්ධයන් වහන්සේගේ පහළවීම ලෝකයේ දුර්ලභ සිදුවීමකි.”**

*(“තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං”).*

**විනය පිටකයට අනුව:** [10]

එක් සමයක අනාථපිණ්ඩික සිටුවරයාට[11] රජගහනුවර තමාගේ නෑදෑයෙකු ගේ නිවසේදී “බුදුන් වහන්සේ” යන උතුම් වදන ඇසීමට ලැබිණි. “බුද්ධ” යන වචනය අසා මහා සොම්නසකට පත්වූ ඔහු මෙසේ පැවසිය:

> **“ගහපතිය, මෙලොව ‘බුද්ධ’ යන ශබ්දය පවා ඇසීම දුර්ලභය; ඒ භගවත් අරහත් සම්මාසම්බුදුන් වහන්සේ මේ වේලාවේ දකින්නට හැකිද?”**
>
> *(“සොසො පි ඛො එසො ගහපති දුල්ලභො ලොකස්මිං යදිදං ‘බුද්ධො’ති; සක්කා නු ඛො ගහපති ඉමං කාලං තං භගවන්තං දස්සනාය උපසඞකමිතුං අරහන්තං සම්මාසම්බුද්ධන්ති”.)*

එලෙස ‘බුද්ධ’ යන ශබ්දය පවා ඇසීමෙන් ඔහු ගේ හදවත උද්දාමයට පත්විය, වහාම බුදුන්වහන්සේ දැකීමේ දැඩි උද්යෝගයක් ඇතිවූයේ ලොව බුදු වරයෙක් පහළවීම අසිරිමත් කරුණක් බව ඔහු දැන සිටි බැවිනි.

**මජ්ජිම නිකාය, සේල සූත්‍රය:**[12]

එක් සමයක බුදුන් වහන්සේ අංගුත්තරපාන ජනපදයේ ආපන නම් ගමේ වැඩසිටින අවස්ථාවක, එම ගමේ වාසය කරණ කෙණිය ජටිල උන්වහන්සේට දානයක් දීමට සූදානම්විය. ඒ අවස්ථාවේදී සේල බමුණා ඔහුගේ 300ක් පමණ වූ සිසු පිරිස සමග එම ස්ථානයට පැමිණියේය. තමාගේ මිතුරු කෙණිය ජටිල මහා දානයක් පිළියෙළ කරනවා දැක ඒ ගැන විමසිය. බුදුන්වහන්සේ ඇතුළු මහා සඟපිරිසට හෙට දින දානය පිණිස ඇරයුම් කළ බව අසා සේල බමුණාට මහා ප්‍රීතියක් ඇතිව් මෙසේ සිතුවේය: “ ‘බුදුහු’ යන හඬ පවා ලෝකයෙහි දුර්ලභය, අපගේ වේදයට අනුව දෙතිස් මහාපුරිස ලක්ෂණ ඇති පුද්ගලයන් දෙදෙනකු පහළවේ.

ඉදින් ගිහිගෙයි සිටිනම් සක්විති රජවේ, ඉදින් සසුන් ගතවන්නේ නම් සම්මා සම්බුදු බවට පත්වේ”.[13] බුදුවරු ලොව පහළවීමේ විරලබව දන්නා සේල බමුණා ඒ වෙලාවේම බුදුන් වහන්සේ වැඩසිටින තැනට පැමිණ උන්වහන්සේ බැහැදැක, පැහැදී බුද්ධත්වය ගැන විමසිය. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“සේල, මේ ලොවේ එක් පුද්ගලයෙක් ගේ පහළවීම ඒකාන්තයෙන්ම දුර්ලභය, ලෝක සත්වයන් ගේ රාග ආදී කෙළෙස් උල් හැරදමන අනුත්තර ශල්‍ය වෛද්‍ය වූ මම සම්බුද්ධ වෙමි”.**

*(“විනයස්සු මයි කංඛ අධිමුච්චස්සු බ්‍රාහ්මණ - දුල්ලබ්භං දස්සනං හොති සම්බුද්ධානං අභින්හසො”).*

බුදුන් වහන්සේ වෙතින් දහම අසා ප්‍රඥා ඇස විවර කරගත් සේල හා ඔහුගේ සිසු පිරිස ආර්ය ශ්‍රාවකයන් බවට පත්වුහ. [14]

## 2: අතීතයේ පහළවු බුදුවරුන් වහන්සේලා [15]

බුදුවරු ලොව පහළවීමේ දුර්ලභ බව අතීතයේ පහළවු ඒ ඒ බුදුන් වහන්සේ ගේ මෙලොව පහළ වීමට ගතවූ කාලය අනුව ද පැහැදිලිවේ. බුද්දක නිකායේ බුද්ධවංසයේ ප්‍රකීර්ණක ඛාණ්ඩයට අනුව විසිඅටක් බුදුන් වහන්සේලා මෙලොව පහළවී ඇත:

“මිට පෙර අප්‍රමාණවූ (ගණන් කළනොහැකි) කල්පයෙහි **තණ්හංකර, සරණංකර, මේධංකර** සහ **දීපංකර** [16] යන බුදුන් වහන්සේ සතර නම පහලවූසේක. දීපංකර බුදුන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු කපයක දී **කොණ්ඩඤ** බුදුන් වහන්සේ මෙලොව පහලවූහ. ඉන්පසු බොහෝ අතුරු කල්ප ගණනාවක් ගතවීමෙන් **මංගල, සුමන** සහ **රේවත** නම්වූ බුදුවරු එක් කපයක පහලවූහ. අනතුරුව දීර්ඝකල්ප ගණනක් ඇවෑමෙන් **සොභිත** බුදුන් වහන්සේ මෙලොව ට වැඩම කළහ. අනතුරුව කල්ප ගණනාවක් ගතවූ පසු පැමිණි කපයක **අනෝමදස්සි, පදුම** සහ **නාරද** යන ලෝකනායක බුදුන් වන්සේලා මෙලොව පහළවූහ. එතැන්සිට බොහෝ අන්තර් කප ගණනාවක් ගෙවීමෙන් මෙලොව පහළවුවේ **පදුමුත්තර** බුදුරජාණන් වහන්සේය.

ඉන්පසුව තිස්දහසක් කප ගෙවීගිය පසු **සුමේධ** සහ **සුජාත** ලෝකනායකයන් වහන්සේලා පහළවී ඇත. ඉලහට පැමිණි කපයෙහි **පියදස්සි, අත්ථදස්සි** සහ ධම්මදස්සි බුදුවරුන් අනු පිලිවෙලින් මෙලොව පහලවූ සේක.

මෙයින් අනුහතරවවෙනි කපෙහි ලෝකවිදූ **සිද්ධාර්ථ** බුදුන් වහන්සේ මෙලොවට වැඩියහ. මෙයින් අනුදෙවෙනි කපෙහි **තිස්ස** සහ **ඵුස්ස** යන සම්බුදුන්වහන්සේලාගේ පහළවීම සිදුවිය. මෙයින් අනුඑක්වෙනි කපෙහි ලෝකනාථයන්වූ **විපස්සි** බුදුන් වහන්සේ ලොව පහළවූ සේක.

මෙයින් තිස්එක්වන කපයෙහි **සිඛි** සහ **වෙස්සභූ** බුදුවරුන් මෙලොවට වැඩමකර ඇත. මේ මහා භද්‍ර කල්පයෙහි **කකුසඳ ,කෝණාගමන, කාශ්‍යප** සහ **ගෞතම** බුදුන් වහන්සේ ලා මෙලොව පහලවූහ. මුලක් දැකීමට පවා අසීරු සසර ගමනේ — දිගු කල්ප ගණනාවක් තුළ පහළවී ඇත්තේ බුදුවරු සීමිත ගණනකි.

ශ්‍රී ලංකාව ඇතුලත් ආසියානු රටවල් විසිඅටක් වූ බුදුන්වහන්සේලගේ ගුණ **'අටවිසි පිරිත'** ලෙසින් සජ්ජායනා කරයි: [17]

> **"මහත්වූ වීර්ය ඇත්තා වූ තණ්හංකර, මහත්වූ කිර්තිය ඇත්තා වූ මේධංකර, ලොවට හිත ඇත්තා වූ සරණංකර, ලොව බබලන්නාවූ දීපංකර ... (ආදීවූ) අටවිසි බුදුන් වහන්සේලාගේ සත්‍ය, ශිල, ඛන්ති, මෙත්තා ඇතුළු උතුම් බල හේතු කරගෙන ඔබට, නිරෝගීබව, සුවය සහ ආරක්ෂාව ලැබේවා!**
>
> *("තණ්හංකරෝ මහාවීරෝ - මේධංකරෝ මහායසො, සරණංකරෝ ලෝකහිතෝ - දීපංකරෝ ජුතින්ධරෝ...තේසං සච්චේන සීලේන - ඛන්තිමෙත්ත බලේන ච,තේපි ත්වං අනුරක්ඛන්තු - ආරෝගෝය්න සුඛේන ච!")*

**දීඝ නිකායේ: මහාපදාන සූත්‍රය** [18] ද පෙර පහළවූ බුදුවරු ගැන මෙසේ පවසයි:

මිට කල්ප අනුඑකකට කට පෙර විපස්සි බුදුන් වහන්සේ පහළ වූහ. සිඛි හා වෙස්සභූ බුදුවරුන් මෙලොව පහළ වුවේ කල්ප තිස්එකකට පමණ

පෙරය. කකුසඳ, කෝණාගමන, කාශ්‍යප හා ගෝතම බුදුවරුන්, භද්‍ර කල්පය ලෙසින් හඳුන්වන [19] මේ කල්පයේදී පහලවුහ. බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

**“මහණෙනි, මේ භද්‍ර කල්පයේදී මම ද, සම්බුද්ධත්වය ලබා මේ ලෝකයෙහි පහළ වී සිටිමි” .**

එම දීර්ඝ කල්පතුල දී **පසේබුදුන් වහන්සේලා** (පච්චේක බුද්ධ) ද මේ ලෝකයේ පහළවී සිටිබව ත්‍රිපිටකයේ පෙන්වා ඇත.[20] එම බුදුන්වහන්සේලාද ස්වකිය උත්සහයෙන්, ස්වයං අවබෝධයෙන් හා උතුම් ප්‍රඥාව පාදක කරගෙන සම්බෝධිය ලබා සසර දුක අවසන් කරගෙන පරිනිබ්බානය ලැබුහ. සම්මාසම්බුදුන් වහන්සේ සහ පසේබුදුන් වහන්සේ අතර ඇති වෙනස ලෙසින් පෙන්වා ඇත්තේ: උතුම් බුද්ධත්වය ලැබුවද පසේබුදුන් වහන්සේට සසර දුක නිමාකරගැනීම පිණිස දහම දේශනා කිරිමට සහ සිව්පිරිස සහිත බුද්ධශාසනය පිහිටුවීමට හැකියාව නොමැත.

මජ්ජිම නිකාය: ඉසිගිලි සූත්‍රයේ දී බුදුන්වහන්සේ 500ක් පසේබුදුවරු පෙර කල ඉසිගිලි පව්වේ වැඩසිටි බව මෙසේ වදාළහ: [21]

**“...එම උතුමෝ භවතණ්හාව අවසන් කලෝය, මහා ආනුභා සම්පන්නය, සියලු කෙළෙස් නිමවා—භවය ක්‍ෂයකර—ස්කන්ධ පරිනිර්වානයෙන් පිරිනිවන් පෑහ. මහා අනුභාව ඇති ඒ ඉසිවරුන්ට නමස්කාර කරන්න...”**

*(“එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා - පච්චේකබුද්ධා භවනෙත්තිඛීණා තෙ සබ්බසඞ්ගාතිගතෙ මහෙසි- පරිනිබ්බුතෙ වන්දථ අපපමෙය්‍යා ති”).* [22]

## 3: අනාගතයේ දී පහළවන බුදුන් වහන්සේ

දීඝ නිකායේ චක්‍රවර්තිසිහනාද සූත්‍රය ට අනුව: [23] ගෝතම බුදුන් වහන්සේ ගේ මහා පරිනිබ්බානයෙන් පසුව දීර්ඝ කාලයක් ඇවෑමෙන් මේ භද්‍ර කල්පය තුළම, අනාගතයේදී, මෛත්‍රිය බුදුන් වහන්සේ පහළ වන බව මෙසේ වදාළහ.

**“මහා දිගුකලක් ගතවූ පසු මතු කාලයේ දී මේ දඹදිව, සංඛ නම් චක්‍රවර්ති රජෙක් උපත ලබයි. අද දින බරණැස් නුවර, අනාගතයේදී කේතුමතී නුවර ලෙසින් හඳුන්වනු ලැබේ, එය රජතුමාගේ අගනුවර වේ. එම රාජධානියේ, දැන් මා බඳු මෛත්‍රිය නම්වූ බුදුන් වහන්සේ පහළවේ. 24**

බුද්දකනිකායේ බුද්ධවංශයේ ද මෛත්‍රිය බුදුන් වහන්සේගේ පහළවීම මෙසේ දක්වා ඇත:

**“මම මෙකල්හි සම්බුද්ධවූ වෙමි, අනාගතයෙහි මෛත්‍රිය නම් බුදු කෙනෙක් ද ලොව පහළ වන්නාහ”.25**

මහායාන සම්ප්‍රදාය මෙසේ දක්වා ඇත:

**“අනාගතයෙහි මෙත්තෙයා නම් නායකයාණෝ සම්‍යක්සම්බුද්ධ වනසේක” 26**

## 4: කල්පයක දිග

කල්පයක දිග, මෙතරම් වසර ගණනක් යයි සංඛ්‍යාත්මකව පැවසිය නොහැක. යොදුනක් උසින්, යොදුනක් පළල සහ යොදුනක් දිග වූ, කිසිදු සිදුරුක් නැති, එක් මහා පර්වතයක් තිබේ නම්, සියවසකට වරක් මිනිසෙකු පැමිණ එය ඉතා සිනිඳු කසී සළුවකින් පිරිමදී නම්, එම පර්වතය කාලය අවැමෙන් ගෙවී යා හැකි වුවද කල්පය නම් අවසන් නොවේ.[27] මෙහි “යොදුන” යනු පැරණි ඉන්දියානු දිග මිනුම් ක්‍රමයකි—යොදුනක් = කි.මි. 13–15 ක් පමණවේ. උදාහරණයක් වශයෙන්, හිමාල කඳුවැටිය, කි.මි. 8.9 ක් පමණ උසය, ඒ අනුව ඉහත උපමාවේ දක්වා ඇති පව්වේ විශාල බව අපට සිතා ගත හැකිය.

දීර්ඝ සසර ගමනේ බුදුවරුන්ගේ පහළ වීමේ දුර්ලභ බව ඉහත උපමාවෙන් විස්තර කෙරිණි. එබැවින් ගෝතම බුදුන් වහන්සේ උපත ලැබූ මේ සමයේ, උන්වහන්සේ දේශනා කල ධර්මය සජීවීව පවතින අද දින බෞද්ධයින් ලෙසින් උපත ලැබීම අප ලද මහා භාග්‍යයක් නොවේද?



බුදුබව ලබන තෙක් මෛත්‍රිය බෝසතුන් තුසිත දෙව්ලොව වැඩසිටි

මිනිසත්බව ලැබීමේ  දුර්ලභ බව බුදුන් වහන්සේ **කණ කැස්බෑවාගේ උපමාවෙන්** විස්තර කර ඇත. [28] වසර 100 කට වරක් මුහුදු පතුලේ සිට උඩට මතුවෙන එක් ඇසක් ඇති කැස්බෑවෙකුට, මුහුදේ පාවෙන එක් සිදුරක් ඇති වියදණ්ඩක් තුළට ස්වකීය ගෙල ඇතුළු කිරීමට ලැබීම යම් තරම් අතිශය දුර්ලභද, මිනිසත් බව ලැබීම ඊටත් වඩා දුෂ්කරය. මෙම උතුම්

බුදු වදන් සිහිපත් කර අප්‍රමාදීව දහම් මඟ වඩා ගැනීමට කටයුතු කිරීම යහපත් බව පැහැදිලි වේ.

**“දුර්ලභ මිනිසත් බවක් ලබා, සද්ධර්මය දැන ගැනීමට ලද මේ උතුම් අවස්ථාවේ වටිනාකම යමෙක් වටහා නොගන්නේ නම් හේ ඒ වටිනා මොහොත නිකරුණේ ඉවතලන අයෙක් වන්නේය”** [29]

*(මනුස්ස ලාභං ලද්ධාය - සද්ධම්මේ සුප්පවෙදිතේ,යේ ඛණං නාධි ගච්ඡන්ති- අතිතා මෙන්ති තේ ඛණංති.)*

## 5: බුදු උපත නිසා ලෝකයට ඇතිවූ සෙත

ඉතා දුර්ලභ සිදුවීමක් වන බුදු උපත, ලෝක සත්ත්වයන්ට මහත් ඵල මහා ආනිසංස ලබාගැනීමට ලැබෙන අගනා අවස්ථාවකි. එයට හේතුව බුදුන් වහන්සේ දැක පැහැදී, සද්ධර්මය ශ්‍රවණය කර උතුම් මාර්ගඵල ලබාගැනිමට වාසනාව උදාකර ගත හැකිවීමයි. අපගේ ගෝතම බුදුන් වහන්සේගේ ජීවිත කතාව දිගහැරෙන විට, එම සත්‍යය ඉතා පැහැදිලිව පෙනී යයි. ත්‍රිපිටකය පුරාවටම බුදුන් වහන්සේ මෙලොව පහළවීමේ අසිරිය හා එයින් ලෝකයාට ලැබුණු සෙත වර්ණනා කර ඇත.

**“බුදුවරුන්ගේ උපත සැනසීම ගෙනෙදේ; සද්ධර්මය ඇසීම සැපයකි.”**

*(සුඛෝ බුද්ධානං උප්පාදො —සුඛා සද්ධම්මදෙසනා.)*
*ධම්මපදය: 194 ගාථාව*

**“බුදුවරුන්ගේ ලොව පහළවීම දුර්ලභය”**

*(කිච්ඡෝ බුද්ධානං උප්පාදෝ)*
*ධම්මපදය: 182 ගාථාව*

## 6: බුදු උපත නිසා නිවන් දොරටු විවෘත වේ

බුදුන් වහන්සේ පහළ වීම කරුණාව, ප්‍රඥාව හා විමුක්තිය එකට එක්වන අසිරිමත් අවස්ථාවකි. නිවනේ [30] සැනසුම පෙන්වා දීම සම්මා සම්බුදුවරුන්ට පමණක් කළ හැකි මහා කරුණා ක්‍රියාවකි. බුදු උපත

අසමසම වූ පුණ්‍ය සිදුවීමක් වන අතර එය මිනිසුන්ට මෙන්ම දෙවියන්ටද උදාවූ මහා භාග්‍යයකි.

බුදුරජාණන් වහන්සේගේ උපත යනු උතුම් පුද්ගලයෙකුගේ පහළ වීම පමණක් නොවේ, සමස්ත ලෝකයට විමුක්තිය උදාවන යුගයක ආරම්භයයි. බුදුන් වහන්සේ වැනි උත්තරීතර, අසමාන්‍ය පුරුෂයෙකු ලෝකයේ පහළ වීම සමස්ත ලෝකයා ලැබූ උතුම්ම තිළිණයයි. එය අසීමිත ප්‍රීතිය ජනිත කරන අනඝි සිදුවීමකි. මන්දයත්, එවන් උතුම් පුරුෂයෙකු මහා වීර්යයෙන් සම්මා සම්බුද්ධත්වය සාක්ෂාත් කොට, අපමණ කරුණාවෙන් හා දයාවෙන් දුකින් මිදීමේ මාර්ගය අපට පෙන්වා දෙන බැවිනි. එවන් අසහාය ගුරුවරයෙක් තමන් හමුවට පැමිණෙන සත්ත්වයන්ගේ සිත නුවණැසින් විමසා, ඒ ඒ පුද්ගලයාට ගැළපෙන පරිදි දහම් දෙසා, සසර දුකින් මිදීමට උතුම් නිවන් මඟ පෙන්වා දෙයි .

ශ්‍රී ලංකාවේ වියත් ගුණවත් නායක තෙරනමක් වූ පූජ්‍ය **කෝදාගොඩ ඤාණාලෝක හිමියන්**, බුදුන් වහන්සේ මෙලොව ජනිත වීමෙන් දෙවියන්ට සහ මිනිසුන්ට උදාවූ අප්‍රමාණ සෙත — නිවන් දොරටු විවෘත වීම මෙසේ පෙන්වා දී ඇත: [31]



කෝදාගොඩ ඤාණාලෝක හිමි

“අප බුදුන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේදී ‘ධම්මචක්කය’ [32] පවත්වන ලද මොහොතේ සිට මහා පරි-නිබ්බානයට පෙර සුභද්‍ර පරිබ්‍රාජකයා[33] දමනය කරමින් ඔහුට ධම්ම මඟ විවෘත කරදුන් වසර හතළිස් පහක කාලය තුළ, මහා මේඝයක් ලෙස අමා දහම් වැසි වස්සවා, අප්‍රමාණ දෙවියන්ට සහ මිනිසුන්ට නිවන් දොරටු විවෘත කළ සේක.” බුදු උපත මඟින් සසර දුකින් මැඩුණු ලෝකයාට නිවනේ සුවය අත්වන අන්දම සූත්‍ර පාඨයන්හි මෙසේ උද්දීපනය කර ඇත: [34]

**“...එක පුද්ගලයෙක් ලෝකයෙහි උපත ලබයි — බහුජනයාගේ යහපත පිණිසය, බහුජනයාගේ සුවසෙත පිණිසය, ලෝකයා කෙරෙහි ඇති**

**අනුකම්පාව පිණිසය, දෙවියන්ගේ සහ මිනිසුන්ගේ යහපත පිණිසය. ඒ කවරෙක්ද? තථාගත අරහත් සම්මාසම්බුදුන් වහන්සේය.”**

තථාගත සම්මා සම්බුදුන් වහන්සේ ලෝකයාට පිළිසරණ පිණිස මෙලොව පහළ වන අතර බුදුන් වහන්සේගේ උපත නිසා ලෝක සත්ත්වයන්ට අමාදහම ලැබීමට වාසනාව උදාවේ. උන්වහන්සේ සම්බෝධිය සාක්ෂාත් කොට විමුක්ති සුවය අත්විඳ, එම අත්දැකීම ලෝකයාගේ හිතසුව පිණිස බෙදා දුන් සේක. එමඟින් අපට නිවනේ සැනසීම ස්පර්ශ කර ගැනීමට වාසනාව උදාවිය. බුදුවරයෙකුගේ ජයග්‍රහණය සමස්ත ලෝකයටම ලබාදුන් ජයග්‍රහණයකි.

## 7: බුදු උපත නිසා ප්‍රඥා ආලෝකය පහළවේ

බුදු උපත නිසා අවිද්‍යා අඳුර නැසී ප්‍රඥා ආලෝකය පැතිරෙයි; දහම් ඇස මැනවින් අවදි වී සුවශාන්ත නිවන් මඟ පෑදේ.

**අංගුත්තර නිකායට අනුව:** [35]

> “එක් පුද්ගලයෙකුගේ උපත නිසා මහා ප්‍රඥා ඇස ලෝකයට උදාවේ; අමා දහම ගලා යයි; සෝතාපන්න තත්ත්වයේ සිට අරහත්වය දක්වා ආර්ය මඟ විවෘත වේ; නිවන සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිපදාව දැකිය හැකිය. ඒ කවරෙක්ද? තථාගත අරහත් සම්මාසම්බුදුන් වහන්සේය.”

**“මනාකොට දෙසූ දහමට අනුව පිළිපදින පුද්ගලයෝ මහා අමරුවෙන් එතෙර වියයුතු සසර සාගරය තරණය කොට නිවන් සුවය ලබන්නෝය”**

*ධම්මපදය: 86 ගාථාව*

## 8: බුදු උපතෙන් දෙවියන්ට උදාවූ සෙත

බුදුන් වහන්සේගේ උපත මිනිස් ලෝකයට පමණක් නොව, දේවලෝකයන්හි දෙවියන්ටද භාග්‍යවන්ත වූ බව ත්‍රිපිටකය පුරාවටම දැකිය හැකිය.

**දීඝ නිකායේ ජනවසභ සූත්‍රයට අනුව:** [36]

බුදුන් වහන්සේගේ පහළ වීම නිසා උතුම් ශ්‍රාවක පිරිසක් ලෝකයේ ඇති වේ. ඔවුන් අතරින් බොහෝ දෙනෙකු මරණින් මතු දේව ලෝකවල [37]උපත ලබති. එම නිසා දේවලෝක පිරී ඉතිරී යන අතර, අසුර ලෝකය පිරිහීමට පත් වේ. [38] මේ හේතුවෙන් දෙවියෝ අතිශයින් සතුටට පත් වෙති.

**දීඝ නිකායේ මාහා ගෝවින්ද සූත්‍රයට අනුව:** [39]

සක් දෙවිඳු පිරිවරා ගත් තව්තිසා වැසි දේවියෝ, බුදුන් වහන්සේගේ පහළවීම නිසා දේවලෝකයට සිදුවූ සෙත මෙසේ වර්ණනා කර ඇත:

**"යම් දෙවි කෙනෙක් භාග්‍යවතුන්වහන්සේ වෙත බඹසර වැස, තව්තිසාවේ නව උත්පත්තියක් ලබා ඇත්ද, ඔහු පැහැයෙන්, යසසින් සෙසු දෙවියෝ ඉක්මවා බැබලේ" එමනිසා ප්‍රමුදිත සිත් ඇති දේවමුළුව බුදු උපත නිසා තමන් ලැබූ භාග්‍ය සිහි කරමින් මෙසේ පවසති: "දෙව්මුළුව පිරේ, අසුර මුළුව පිරිහේ!"**

**සුත්ත නිපාත, නාලක සූත්‍රයට අනුව:** [40]

එක් සමයක දිවා විහරණයෙන් නැඟී සිටි අසිත තවුසාට, [41] සක්දෙවිඳු [42] පිරිවරාගත් තව්තිසා දේව සමූහයා දිව්‍ය සළු ලෙලදෙවමින්, දේව කොඩි වනමින්, ප්‍රීති ගී ගයමින් මහා උද්දාමයකින් අහස බබළවමින් සිටිනු පෙනිණි. කුතුහලයට පත් තවුසා දේව සමූහයා වෙත පැමිණ, ඔවුන්ගේ අසීමිත ප්‍රීතියට තුඩුදුන් කරුණ කුමක්දැයි විමසීය. එවිට දෙවියෝ මෙසේ පැවසූහ:

**"ශාක්‍ය දේශයේ ලුම්බිණි ගම්මානයේ දී අසමසම, විශිෂ්ට මැණිකවූ — බෝසතුන් වහන්සේ, දෙවි මිනිසුන්ගේ යහපතට අද දින උපන්නෝය. එම නිසා අපි තුටු වෙමු, ප්‍රීතියෙන් ගී ගයමු. සියලු ලෝකයට අග්‍ර වූ, නර ශ්‍රේෂ්ඨ වූ, ඒ උතුමන් මහා සිහ රජෙකු මෙන්, දම්සක කරකවා ඉසිපතනයේදී, දහම් වැසි වස්සවා- ලොවට සෙත ගෙන දේ."**

සම්බෝධිය ලබා බුදුන් වහන්සේ අමා මහා දහම පතුරුවන අතර දෙවියන්ට ද ධර්මය ශ්‍රවණය කර නිවනේ සුවය ස්පර්ශ කිරීමට වාසනාව

සැලසේ. සංයුත්තනිකායේ: දේවතා, දේවපුත්‍ර, සක්ක, යක්ක යන සංයුත්තයන් පුරාම දැකිය හැක්කේ බුදුන් වහන්සේ ලොව පහළ වීම නිසා මිනිස් ලෝකයෙන් එහා ඇති දේවලෝකයන්හි පහළ වූ දෙවිවරුන් සහ වෙනත් අමනුෂ්‍ය කොට්ඨාස, බුදුන් වහන්සේට නමස්කාර කිරීමට, දහම ඇසීමට සහ දහම් ගැටලු විසඳා ගැනීම පිණිස උන්වහන්සේ සොයා මිනිස් ලොවට පැමිණි අවස්ථාවන්ය.

බුදුන්වහන්සේගේ පහළවීම මිනිසුන්ට පමණක් නොව, දෙවියන්ටද මහා සොම්නස උදා කරන සිදුවීමකි!

## 9: බෝසතුන් තුසිත දෙව්ලොව වැඩසිටීම

සම්ප්‍රදාය මෙන්ම පිටකය ද පෙන්වා ඇත්තේ සියලු බෝසත්වරු, මිනිස්ලොව අවසාන උත්පත්තිය ලැබීමට පෙර තුසිත දේවලෝකයේ වැඩසිටින බවය. [43] අපගේ ගෝතම බුදුන් වහන්සේ මිනිස් ලොව පහළවීමට පෙර තුසිත දේවලෝකයේ [44] බෝධිසත්වයන්, ලෙසින් වැඩසිටි බව මේ සූත්‍ර පාඨයෙන් පැහැදිලිවේ:

**‘ආනන්දය, බෝසත්හු සති සම්පජානයෙන් යුතුව තුසිතයේපහළ වූහ, සති සම්පජානය සහිතව එහි වාසය කළහ, බෝසත්හු සති සම්පජානය ඇතිව තුසිතයෙන් චුතව (මිනිස් ලොව) මව් කුස පිළිසඳ ගත්හ”.** [45]

### 9.1: දේව ආරාධනාව

බෞද්ධ සම්ප්‍රදාය ද බෝසතුන් වහන්සේ මිනිස් ලොව පහලවීම විචිත්‍ර ලෙස මෙසේ පෙන්වා ඇත. තුසිත දේවලෝකයේ දෙවියන් බෝසතුන්ට මිනිස් ලොව උපතක් ලැබීමට ඇරයුම් කිරීම ‘දේව ආරාධනා’ ව ලෙසින් හඳුන්වයි. [46] දෙවියෝ බෝසතුන් බැහැදැක මෙලෙස ආරාධනා කරණ බව සම්ප්‍රදාය පවසයි.

“***කාලො යන්තෙ මහා වීර*** – මහා වීරයන් වහන්ස, කාලය පැමිණ ඇත. ***උප්පජ්ජ මාතු කුච්ඡියං*** – මිනිස් මව් කුසක පිළිසිඳ ගන්න. ***සදෙවකං තාරයන්තො බුද්ධස්ස අමතං පදං*** – දහම් දෙසා දෙව්මිනිස් ලෝකයා සසර දුකෙන් එතෙර කරවන්න.”



දේව ආරාධනාව

(ඡායාරූප හිමිකම [47])

## 9.2: පස්මහා බැලුම්

එකල්හි බෝසතාණන් වහන්සේ “**පඤ්ච මහා විලෝකනය**” (පස්මහා බැලුම්) කළහ . එනම්: කාලය, දීපය, දේශය, කුලය සහ මව ආදීවූ කරුණු ය. (කාලං දීපං ච දෙසං ච – කුලං මාතරමෙව ච එතෙ පඤ්ච විලොකෙත්වා – උප්පජ්ජන්ති තථාගතා). [48] පස්මහා බැලුම් පිළිබඳව පැරණි සිංහල සම්භාව්‍ය ග්‍රන්ථයක් වන පූජාවලිය මෙසේ පවසයි: [49]

**කාලය**: මිනිස් ආයුෂ බොහෝ දිගු ඇති විට දුක අවබෝධ කරගැනීම අපහසුය, ආයුෂ ඉතා කෙටි කාලවලදී අකුසල කටයුතු බහුල වේ. එම නිසා එවකට දඹදිව මිනිසුන්ගේ ආයුෂ අවුරුදු 120ක් පමණ වූ සුදුසුම කාලය බෝසතුන් තෝරාගන්නා ලදී.

**දීපය:** අනන්ත වූ බුදුවරුන්ගේ උත්පත්ති ස්ථානය වූ ජම්බුද්වීපය (දඹදිව) තෝරාගන්නා ලදී.

**දේශය:** මධ්‍ය මණ්ඩලය හෙවත් බුදුවරුන් උපත ලබන මජ්ඣිම දේශය තෝරාගන්නා ලදී.

**කුලය:** එවකට ශාක්‍ය රජ කුලය උතුම් කොට සැලකූ බැවින්, සාධාරණ පාලකයෙකු වූ සුද්ධෝදන රජුගේ සූර්යවංශික පරම්පරාව කුලය ලෙසින් තෝරාගන්නා ලදී.

**මව:** සසර බොහෝ ජීවිතවල සිල්වත් ජීවිතයක් ගත කරමින් බෝසතුන්ගේ මව වීමට පෙරුම් පුරා ඇති, උත්තරීතර ගුණාංගවලින් හෙබි මහාමායා දේවිය මව ලෙසින් තෝරාගන්නා ලදී.

## 10: බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම

පිටකයේ සඳහන් නොවුවද, සම්ප්‍රදායට අනුව: දේව ආරාධනාවෙන් පසුව ලෝකය දෙස නෙත් යොමුකළ බෝසතුන්වහන්සේ ට , අප්‍රමාණ වූ සසර දුකින් පෙළෙන ලෝක සත්වයා දර්ශනය විය. අසීමිත ජීවිත ගණනාවක් තුළ උතුම් ආධ්‍යාත්මික ගුණාංග පරිපූර්ණ කළ බෝසතාණන් වහන්සේ, මහා කරුණාවෙන් ලෝක සත්වයන් දෙස බලා අවසාන වරට මිනිස් ලොව උපත ලැබීමට අදිටන් කළහ. [50]

එලෙස බෝසතුන් දඹදිව මධ්‍ය දේශයේ [51] කපිලවස්තු නුවර [52], සුද්ධෝදන ශාක්‍ය රජතුමාගේ අගබිසව වූ මහාමායා දේවියගේ [53] කුස තුළ ඇසළ පුන් පොහෝ දිනක පිළිසිඳ ගත්හ. [54]

## 11: බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් අවස්ථාවේදී සිදුවූ අසිරිමත් ලක්ෂණ

බුදුන් වහන්සේ බෝසතුන් ලෙසින් මව්කුස පිළිසිඳ ගැනීමේ අවස්ථාව මේ සූත්‍ර පාඨයේ ඉතා ගාම්භීරව පෙන්වා දී ඇත: [55]

> **"යම් කලක බෝසතුන් තුසිත දෙව්ලොවින් චුතව මව්කුස පිළිසිඳ ගත්තේද, එකල්හි දේවානුභාවය ඉක්මවා යන මහා ආලෝක දහරාවක්**

**අහස පුරා පැතිරී යන්නේය. එකල්හි සඳ හා හිරුගේ ආලෝකය පවා නොලබන, මහා ඝන අඳුරින් වැසුණු ලෝකාන්තරික නිරයන් පවා ආලෝකමත් වේ.**

**එවැනි ස්ථානවල මහා අඳුරේ සිටින සත්වයන්, එම ආලෝකය නිසා තමන් සමඟ සිටින වෙනත් සත්වයන්ද පළමු වරට දකිති. එමෙන්ම දසදහසක් ලෝක ධාතුවම ප්‍රීති ඝෝෂා පවත්වන්නාක් මෙන් කම්පා වේ, චලනය වේ."**



දිවැසින් ලෝකය දෙස බලන බෝසතුන්ට ලෝක සත්ත්වයා මුහුණදෙන අප්‍රමාණ සසර දුක දර්ශනය වීම.

උත්තරීතර මහා පුරුෂයෙකුගේ පහළ වීම—අවිද්‍යා අඳුරින් වැසීගිය ලෝකයාට මහා කරුණාවෙන්, අපමණ දයාවෙන් දුකින් මිදීමේ මග පෙන්වාදුන් බුදුන් වහන්සේ ගේ පහළවීම එසේ වර්ණනා කර ඇත.

## 12: මහමායා දේවිය දුටු සිහිනය

තුසිත දෙව්ලොව සිට බෝසතුන් මව්කුසට බැසගත් අවස්ථාවේ, බෝසත් මෑණියන් වූ මහාමායා දේවිය අපූර්ව සිහිනයක් දුටු බව බෞද්ධ සම්ප්‍රදාය පවසයි: ඇසළ පුර පසළොස්වක රාත්‍රියක මහාමායා දේවිය රජ මාලිගාවේ

සැතපී සිටියදී, සතර වරම් දෙවිවරු [56] පැමිණ ඇයගේ යහන ඔසවාගෙන හිමාලය අසල අනෝතත්ත විල [57] වෙත ගෙන ගියහ. එහිදී දේව බිසවුන් විසින් දේවිය නාවා, සුවඳ විලවුන් ගල්වා, දිව්‍ය වස්ත්‍ර පළඳවා රන් ප්‍රාසාදයක ඇති යහනක සැතපවූහ. එවිට රන්වන් සේසතක් ගත් සුදු ඇත් පැටවෙකු දකුණු දෙසින් පැමිණ, යහන වටා තුන් වරක් ප්‍රදක්ෂිණා කර, ඇයගේ කුස තුළට දකුණු ඇළයෙන් ඇතුළු වූවාක් මෙන් එතුමියට දැනිණි. [58] එම සිහිනය බෝසතුන්ගේ අවසාන උපතේ පූර්ව නිමිත්තක් ලෙස සම්ප්‍රදාය විස්තර කරයි — එය ලෝකයාට ඉමහත් සහනයක් ගෙන දෙන උතුම් මහා පුරුෂයෙකුගේ පහළ වීම සංකේතවත් කිරීමකි.



මහාමායා දේවිය දුටු සිහිනය

(ඡායාරූප හිමිකම: [59])

## 13: බෝසතුන් ගේ උතුම් උපත පිලිබඳ විස්තර

සුත්තනිපාතයේ, **නාලක සූත්‍රයේ දී** බුදුන් වහන්සේ බෝසතුන් ලෙසින් ලුම්බිණි ගම්මානයේ උපත ලැබීම නිසා දෙවියෝ සතුටට පත්වූ බව ඉහතදී සඳහන් කෙරිණි. ත්‍රිපිටකය එම අවස්ථාව දීර්ඝ ලෙස විස්තර නොකළද, බෞද්ධ සම්ප්‍රදාය එම සිදුවීම ඉතා විසිතුරුව සටහන් කර ඇති බව මතු දැක්වෙන විස්තර වලින් පැහැදිලිවේ. [60] සම්ප්‍රදාය මෙසේ පවසයි: පුරාණ භාරතීය චාරිත්‍රයට අනුව, ගැබ් කාලය පූර්ණ වූ විට

මහාමායා දේවිය කෝලිය රාජවංශයේ අගනුවර වූ — ස්වකීය දෙමව්පියන් වාසය කරන — **දේවදහ නුවර** බලා පිටත් වූවාය. පුරාණ සංස්කෘත සාහිත්‍ය කෘති වන ලලිතවිස්තරය, [61] ජිනචරිතය [62] ආදියේ එම ගමන විසිතුරු ලෙසින් වර්ණනා කර ඇත. මෙහිදී, සම්ප්‍රදාය පවසන එම ගමන් මග, වර්තමාන ලෝකයට ගැළපෙන ආකරය— ඉතිහාසමය හා පුරාවිද්‍යාත්මක කරුණු අනුව සනාථවන ආකාරය ගැන සොයා බැලීම සුදුසුය. එමගින් මිට සියවස් ගණනාවකට පෙර සිදුවූ අපූර්ව සිදුවීම, ප්‍රබන්ධ කතාවක් ලෙසින් ඉවත දැමිය නොහැකි බව පෙනී යයි.



මහමායා දේවිය කපිලවස්තුවෙන් නික්මීම- බොරෝබුදූර් ගල් කැටයම

සම්ප්‍රදාය මෙන්ම ඉතිහාසමය තොරතුරු අනුව, පුරණ දේවදහ නුවර, කෝලිය ශාක්‍යයන්ගේ අගනුවරය ය. සිදුහත් කුමරුගේ මෑණියන් වූ මයා දේවිය සහ සුළුමව වූ පජාපති දේවිය උපන් ස්ථානය එම නුවරය. [63] බාල කාලයේ සිදුහත් කුමරු දේවදහ නුවර, කෝලිය රජහවනේද වාසය කර ඇතය යි සම්ප්‍රදාය පවසයි. බුදුන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේ එම ස්ථානයේ වැඩසිටි බව පිටකය මෙසේ දක්වා ඇත:

**“ එක්සමයක බුදුන් වහන්සේ, ශාක්‍ය ජනපදයේ [64] දේවදහ නම් නුවර වැඩ සිටිසේක”.**[65]



මහමායා දේවිය උපත ලැබූ ස්ථානයේ ඉදිකර ඇති ස්තූපය-
ඡායාරූප හිමිකම : **විකිපීඩියා**



**දේවදහ නුවර පුරාණ නටබුන්-** ඡායාරූප හිමිකම: **විකිපීඩියා**

අද දින දකුණු නේපාලයේ රූපන්දී (රුමින්දෙයි) දිස්ත්‍රික්කයේ, [66] රෝහිණී නදිය [67] අසබඩ පිහිටි 'දේවදහ' නම් ස්ථානය පැරණි **දේවදහ නුවර** ලෙසින් පිළිගෙන ඇත. පුරාණයේ දේවදහ නුවර එනමින් හඳුන්වා ඇත්තේ එහි තිබූ ජලාශයක් "දෙවියන්ගේ පොකුණ" (දේවදහ) ලෙස එකල ප්‍රසිද්ධ වී තිබූ බැවිනි. මෑතකදී දේවදහ අසල කරන ලද පුරාවිද්‍යා කැණීම්වල ප්‍රතිඵලයක් ලෙස සොයාගත් පැරණි ආරණ්‍ය නටබුන්, ගඩොලින් සකස් කළ ව්‍යුහ හා මැටි බඳුන් ආදිය බුදු සමයේ පැවති

කෝලිය රාජධානියේ අගනුවර මෙය බව සනාථ කරයි. [68] එම කැණීම් මගින්අශෝක අධිරාජයා විසින් බුදුන් වහන්සේගේ මව්තුමියට ගරු කිරීම පිණිස ඉදිකරණ ලද යයි සලකන ස්ථූපයක් ද මතුවී ඇත.මහමායා දෙවිය උපන් ස්ථානයේ ගොඩනංවා ඇතයි සලකන එම ස්තූපය වන්දනා කිරීමට බොහෝ පිරිස අද දිනද දේවදහ නුවරට පැමිණේ.




වර්තමාන සිතියම් දත්තවලට අනුව [69] කපිලවස්තු හා ලුම්බිණිය අතර දුර කි.මී. 30ක් පමණ වන අතර, ලුම්බිණිය සහ දේවදහ අතර දුර කි.මී. 54 ක් පමණ වේ. (බලන්න: ඉහත දක්වා ඇති ගූගල් සිතියම) කපිලවස්තු, ලුම්බිණිය හා දේවදහ එකිනෙකට යාබදව පිහිටි ස්ථානයන්ය. කපිලවස්තු පුරයේ සිට දේවදහ නුවරට ගමන් කළ මහාමායා දේවිය, විවේකය පිණිස ගමන් මඟ අසබඩ පිහිටි ලුම්බිණියට පැමිණීම ඉතා ස්වභාවික සිදුවීමකි. කපිලවස්තු, ලුම්බිණිය හා දේවදහ ආදී පුරාණ ස්ථාන, අද දිනද එම නම් සහිතව නේපාල සිතියමේ සටහන් කර ඇත.

ඉතිහාසඥන්ට අනුව [70] කපිලවස්තු නුවර, පුරාණ '**උත්තරපථ**' නම්වූ ප්‍රසිද්ධ වෙළඳ මාර්ගය හා අතුරු මගිකින් සම්බන්ධව තිබී ඇත. එම මග උතුරු ඉන්දියාව හරහා දකුණු දිගට විහිදී ඇත. [71] මතු දැක්වෙන සිතියමට

අනුව එම මග ගන්ධාර දේශයේ සිට කෝසල රාජධානිය හරහා විහිදී ඇත. [72] සාවස්ති නුවරදී, ඒ මහා මග කපිලවස්තු පුර සිට එන අතුරු මගකට සම්බන්ධවූ බව පෙනේ. දේවදහ නුවර බලා ගමන් කල මහමායා දේවිය උත්තර පථ හා කපිලවස්තු නුවර එක්වන අතුරු මගේ ගමන් කළා විය හැකිය.




ඉතිහාසඥයන් පවසන්නේ 'උත්තරපථ' මාවත **ගන්ධාර දේශයේ** සිට විහිදී **තක්ෂිලාව** හරහා **ඉන්ද්‍රප්‍රසාත්** නුවරට, එතැන් සිට **මථුර, සාවස්ති, සාකේත, කාසි** හරහා බටහිර දෙසට **විසාලා නුවර, රජගහනුවර ඔස්සේ චම්පා නුවර හරහා ත්‍රාමලිප්ති** නම්වූ පුරාණ තොටුපල අසලින් අවසන්වන බවය. මේ මහා මාර්ගය එවක පැවති වෙළඳ සහ සන්නිවේදන මහා මගකි. ඉතිහාසමය සහ පුරාවිද්‍යා සාක්ෂි අනුව ක්‍රි.පූ. 6-5 නි කාල සීමාවේ පටන්ම

මේ මග ක්‍රියාකාරී වූ ජනප්‍රිය මගක් විය. වෙළඳුන්, සංචාරකයන් මෙන්ම, විවිධ ආගමික නායකයන් සහ වන්දනා කරුවන්ද එම මග භාවිතා කර ඇත. ඉතිහාසඥයන් පවසන්නේ බුදුන් වහන්සේ සිය ධම්ම චාරිකා පිණිස මේ මග භාවිතා කර ඇතිබවය. [73]



ලුම්බිණි උයනේ අසිරිය

## 14: මහාමායා දේවිය ලුම්බිණි උයනට පැමිණීම සහ බෝසතුන්ගේ උපත

අපගේ බුදුන් වහන්සේ උපත ලැබූ පූජනීය භූමිය ලෙස සලකන ලුම්බිණිය, ඒ දවස කපිලවස්තු හා දේවදහ නගර අතර පිහිටි සල්ගස්වලින් පිරි වනගොමුවක් බව සම්ප්‍රදාය විස්තර කරයි. කපිලවස්තු සහ දේවදහ නගර දෙකටම පොදු වූ, ලුම්බිණි උද්‍යානය නමින් හැඳින්වුණු මනරම් සාල වනයක් එහි විය. එම රාජධානිවල වැසියෝ විනෝදය හා විවේකය පිණිස ලුම්බිණි උයනට පැමිණියහ. මහාමායා දේවිය ලුම්බිණියට පැමිණි අවස්ථාවේ උයන අතිශයින් සිත්කළු වී තිබුණි. සෑම සල් ගසක්ම මුල සිට ඉහළම අතු දක්වා මලින් බර වී තිබුණි. එම මල්වලින් ගලා ආ මිහිරි සුවඳින් අවට වාතය සුවඳවත් වී තිබූ අතර, නානාවිධ සමනලුන් හා

කුරුල්ලන්ගේ මිහිරි නාදයෙන් උයන චමත්කාර විය.එම මනරම් ලුම්බිණිය සක්දෙව්දුගේ චිත්‍රලතා උයනට හෝ නන්දන උයනට සමාන කල හැකිය. [74] ශාක්‍යයන් හා කෝලියයන් විසින් මැනවින් නඩත්තු කරන ලද මෙම උයන, නිසල සුවය සහ ශාන්තිය සංකේතවත් කළ පුණ්‍ය භූමියකි. බෞද්ධ සාහිත්‍යයේ ලුම්බිණිය "ප්‍රාතිමෝක්ෂ වනයක්" —



ලුම්බිණි උයනේ උතුම් බෝසත් උපත

එනම් විමුක්තියේ පූජනීය වනයක් ලෙස වර්ණනා කර ඇත. [75]

(ඡායාරූප හිමිකම [76])

ගමන් විධාව සංසිඳුවා ගැනීමට සහ උයනේ සිරි නැරඹීමට සිතූ මහාමායා දේවිය, ස්වකීය පරිවාර කතුන් සමඟ ලුම්බිණි උයනට පිවිසියාය. එහි වූ සිසිල් පොකුණකින් ස්නානය කර, නව වස්ත්‍රාභරණයෙන් සැරසී, ප්‍රමෝදයෙන් උයනේ සොබාසිරිය බලමින් සිටියාය .එහිදී මලින් පිරිගිය සල් ගසක අත්තක් ඇගේ මුදු දෑතින් අල්වාගත් මොහොතේ — අප බෝසතාණන් වහන්සේ ඒ උතුම් මව්කුසින් මෙලොවට බිහි වූහ.

සෑම බෞද්ධ සම්ප්‍රදායක්ම පිළිගන්නේ අපගේ ගෝතම බුදුන් වහන්සේ, ශාක්‍යවංශයේ කුමාරයෙකු ලෙස පුරාණ දඹදිව, ලුම්බිණි උයනේදී උපත ලැබූ බවයි. සූත්‍ර පිටකය එම අසිරිමත් සිදුවීම මෙසේ සැකෙවින් දක්වයි: [77]

**"සම්බෝධියට උතුම්, අසමසම බෝසතුන් — දෙව් මිනිස් ලෝකයේ හිතසුව පිණිස, ශාක්‍ය ජනපදයේ ලුම්බිණියේ උපත ලැබූහ."**

## 15 : බෝසත් උපතේ දී සිදුවූ අපූර්ව හා අසිරිමත් සිදුවීම්

බෝසතුන් ලොව පහළ වීම අසිරිමත් සිදුවීමකි. එතුමන්ගේ උත්පත්තිය උත්තරීතර මහා පුරුෂයෙකුගේ පහළ වීම සටහන් කරයි.



සතරවරම් දෙවියෝ බෝසතුන් පිළිගැනීම- ශ්‍රී ලංකාවේ පන්සල් බිතුසිතුවමකි

බෝසතුන් උපත ලැබූ අවස්ථාවේ සිදු වූ අපූර්ව සිදුවීම් පිටකයේ මෙසේ විස්තර කර තිබේ: [78]

අන්‍ය ස්ත්‍රීහු නවයක් හෝ දස මාසයක් දරුගැබ දරා ප්‍රසූත කරති; බෝසත් මව දසමසක්ම සම්පූර්ණ කර දරා සිට ප්‍රසූත කරයි. අන්‍ය ස්ත්‍රීහු ඉඳගෙන

හෝ ඇලවී ප්‍රසූත කරති; බෝසත් මව සිටගෙනම දරුවා බිහිකරයි. බෝසතුන් උපන් විගස සතර වරම් දෙවිවරුන් දරුවා පිළිගෙන මෙසේ පවසති:

**'දේවියනි, ඔබට මහා බලසම්පන්න උතුම් පුත්‍රයෙක් ලැබී ඇත.'**

එකල්හි උණුසුම් හා සිසිල් ජල දහරාවන් දෙකක් අහසින් පතිත වී මව් හා දරුවා පිරිසිදු කරයි. දේවානුභාවය ඉක්මවා යන මහා ආලෝකයකින් මුළු ලෝකයම බැබළී යයි.

## 16: බෝසතුන්ගේ සත් පියවර සහ සිංහ නාදය

සූත්‍ර පිටකය තවදුරටත් ඒ අපූර්ව සිදුවීම් මෙසේ විස්තර කරඇත: උපන් ඇසිල්ලෙහි බෝසතුන් උතුරු දිශාවට සත් පියවරක්තැබූහ. දිව්‍යමය සේසත් ඉහළින් නංවා තිබුණි. එසේ පියවර තබා, සෑම දිශාවක්ම බලා, අභීතව සිංහ නාද කළහ:

**'මම ලොවට අග්‍ර වෙමි -මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි,**
**මම ලොවට ජේෂ්ඨ වෙමි,**
**මේ මාගේ අන්තිම උත්පත්තියයි;**
**නැවත පුනර්භවයක් නොමැත'.** [79]

*("අග්ගොහමස්මි ලෝකස්ස, සෙට්ඨොහමස්මි ලෝකස්ස,*
*ජෙට්ඨොහමස්මි ලෝකස්ස, අයමන්තිමා ජාති නත්ථිදානි*
*පුනබ්භවොති".)*

මෙය හුදෙක් ආශ්චර්යයක් පමණක් නොව—මතු සම්බෝධිය උදාකර ලෝකයාට නිවන් මග දක්වන උත්තරීතර මහා පුරුෂයකුගේ අභීත ප්‍රකාශයකි. බෝධිසත්ව උපතේදී සිදු වූ විශේෂ සිදුවීම් මතු දිනක සම්බෝධිය සාක්ෂාත් කරගත් ජයග්‍රහණයේ පූර්ව නිමිති ලෙස අටුවාවේ මෙසේ විස්තර කර ඇත:

**පාද ස්ථිර ලෙස බිම තැබී:** ආධ්‍යාත්මික බලය දෙන සතර ඉද්ධිපාද ලැබීමයි.**උතුර බලා පියවර තැබීම:** සාමාන්‍ය ලෝකයෙන් නික්මී උත්තරීතර භාවයට පත් වීමයි.**සත් පියවර සටහන්:** සප්ත බොජ්ඣංග

ධර්මයන් සාක්ෂාත් කරගැනීමයි.**සුදු කුඩය (සේසත):** පිරිසිදු වූ අර්හත් විමුක්තිය ලැබීමයි.**සිව් දෙස බැලීම:** සර්වඥතා ඥානය පහළ වීමයි. **සිංහ නාදය:** කිසිවෙකුට ආපසු හැරවිය නොහැකි උතුම් ධර්මචක්ක පවර්තනයයි. **අවසාන උපත:** නිවන ලැබීමෙන් යළි උපත නතර කිරීමයි.



බෝසතුන් සත්පියවර තැබීම

*(ඡායාරූප හිමිකම* [80]*)*

## 17. බුදු උපතේ අසිරිය

බුදුන් වහන්සේ මෙලොව උපත ලැබීමේ අසිරිය අනන්ත අප්‍රමාණ ලෙසින් වර්ණනා කර ඇත. ඒ අතරින් අප තෝරාගත් කවිපද කිහිපයක් මතු දැක්වේ:

## තුසිතයෙන් මිනිස් ලොවට

අහස් තලයේ මතු බුදුවෙන බෝසතුන්
සුවයෙන් වැඩ සිටින විට —මිනිස් ලොව ඉපදෙන්න
කල් පැමිණි බව දැනුණා තුසිත දෙව්වරුන්ට.

**"උතුමාණෙනි මිනිස් ලොව යළි උපදින්න,**
**සතහට පිහිටවන්න !"**
මහා බැතියෙන් ඇරයුම් කළා දෙව් පිරිස,
අපගේ බෝසතුන්ට.

මහා කාරුණික බෝසතුන් දෙව් ඇරයුම පිළිගත්තා,
පස්මහා බැලුම් බලා අප වෙනුවන් මෙහි වැඩියා.

**'මේ තමා අන්තිම උපත, යළි උපතක් නම් නැත,**
හිමෙන් වැසුන පාමුල හිමාල වැටිය අද්දර-
සාධු ජනයා වසන—ගුණවත් රජෙක් රජකරණ,
කැත් දනව්වට යන්නෙමි —එහි උපත ලබන්නෙමි'.

ශ්‍රීමත් එඩ්වින් ආර්නෝල්ඩ්: ආසියාවේ ආලෝකය (Light of Asia)
ඇසුරින්. [81]

## මනරම් සල් ගොමුවේ බෝසත් උපත!

එ මනරම් සොඳුරු සල් ගොමුවේදී,
දරු උපතට කාලය එළඹී යැයි — උතුම් දේවියට හැඟුණා —
ඕ සුමුදු පියවර තබමින් — රන් වියනට ඇතුළු වූවා,
පිරිවර කතුන් ආදරයෙන් — දේවිය පිළිගත්තා.

සුබ සඳ මඬල පුස්ස නැකත් තරුවට පිවිසුණා,
ඒ සුභ මොහොතේ උතුම් බෝසතුන් වහන්සේ,
මව්තුමියට සුව සලසමින් නික්මුණා කුස තුළින්,
රන්වන් හිරු මඬල අහසේ උදාවන ලෙසින්.

ළදරු කුමරුගේ සොඳුරු මුව මඬල,
රන් මුවා පතක් සේ — ආලෝක කළා දස අත,
සුමුදු නිල්වන් දෑස් දල්වා — කුමරු ලොව බැබළුවා,
මුළු අහස් තලයම රන් පැහැයෙන් ඔකඳ වූවා.

රන්වන් මටසිලුටු දෙපා — රත් පියුම් විලසින් නැඟී,
ඔකඳ කරමින් මිහිකත මව — තැබුවා උතුම් සිරිපා —
ඇයගේ හද මඬල තුළ — සත් තරු වැල සැරිසරන ලෙසින්
සත් පියවරක් තැබුවා — උතුම් බෝසතුන් අපගේ.

මහාකවි අශ්වඝෝෂයන්ගේ ‘බුද්ධ චරිතය’ ඇසුරින්. [82]

පළමු කාණ්ඩය මෙතැනින් අවසන්වේ. දෙවන කාණ්ඩය: **“බුදු උපත සිදුවූ පූජනීය භූමිය”** : බුදුන් වහන්සේ උපත ලැබූ ස්ථානයවන ශාක්‍ය ජනපදයේ ලුම්බිණිය සහ බුදුන් වහන්සේ ගේ උපත සිදුවූ කාලසීමාව පිලිබඳ සූත්‍ර දේශනා, සම්ප්‍රදාය, ඉතිහාසමය හා පුරාවිද්‍යා සාක්ෂි ගැන විස්තර කිරීමට නියමිතය.

## 1 කාණ්ඩය: අවසාන සටහන්

[1] ගෝතම බුදුන් වහන්සේ අතිතයේ පහළවූ දීපංකර ආදී බුදුවරුන්ට පසුව පහළවූ 25නි බුදුන් වහන්සේය. ත්‍රිපිටකය පුරාම උන්වහන්සේ හඳුන්වා ඇත්තේ ගෝතම බුදුන් ලෙසිනි. ගෝතම යනු පෙළපත් නාමයය. බලන්න: බුජ.ත්‍රි: කු.නි: බුද්ධවංශ හා චරියාපිටකය: 25:ගෝතම බුද්ධවංශය.

[2] ත්‍රිපිටකය: පාලි භාෂාවෙන්: කූඩා තුනක්-කොටස් 3ක්- (Three Baskets) යන අර්ථය ඇති බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ඇතුලත් පොත් පෙලය. එනම්: 1) සූත්‍ර පිටකය (බුද්ධ දේශනා-සූත්‍ර) 2) විනය පිටකය (සංඝයා ගේ යහපත පිණිස පනවා ඇති විනය නීති හා උපදෙස්) 3) අභිධම්ම පිටකය (බුද්ධ දේශනා පිලිබඳ විශ්ලේෂණ).

[3] බෞද්ධ සම්ප්‍රදාය දැක්වීමට මෙහිදී විශේෂයෙන්ම භාවිතා කළේ භද්දන්ත විචිත්තසාරභිවංස (Mingun Sayādaw ) විසින් රචිත ‘බුදුවරුන්ගේ මහා වංශ කථාව’ (The Great Chronicles of the Buddhas by Mingun Sayādaw) නම් කෘතියය.

[4] බුදුන් වහන්සේ යන්නෙහි මූලික අර්ථය ලෙසින් දක්වන්නේ සම්බෝධිය ලැබූ උතුමා- අවිද්‍යා අඳුර පහකර විද්‍යා ආලෝකය ලැබූ මුණිවරයායා. නිවන් මග පෙන්වා දෙන උතුම් ගුරුවරයා ආදී ලෙසින්ය. මෙහිදී අපි බුදුන් වහන්සේ යන පදය මූලික වශයෙන් යොදා ගෙන ඇත්තේ අපගේ ගෝතම බුදුන් වහන්සේ හඳුන්වාදීම පිණිසය.

[5] බෝධිසත්ව- බෝසත්: බුදුවීමට අදිටන් කර, උතුම් පාරමී සම්පූර්ණ කරගන්නා උතුමාය. බොධි යනු ප්‍රඥාව මූලික කරගත් අවදිවීමය- කෙළෙස් නින්දෙන් නැගිට යථාර්ථය දැකීමය. සම්ප්‍රදායට අනුව ගෝතම බුදුන්වහන්සේ සාරාසංඛකල්ප ලක්‍ෂයක් කාලයතුල බුදුබව පතා ආධාත්මික ජීවිතය ගොඩනගාගෙන ඇත. බලන්න: බුජ.ත්‍රි: ඛු.නි: බුද්ධවංශ හා චරියාපිටකය.

[6] පාරමි (පාලි) හෝ පාරමිතා (සංස්කෘත) යන්නෙන් "පරිපූර්ණත්වය" හෝ "සම්පූර්ණත්වය" අදහස් වේ. බෝසත්වරයෙක් බුදුබව පතා යන ගමනේ සපුරාලන උත්රිතර ගුණ සමුදාය ය. පාරමී 10ක් වේ: දාන, ශිල, නෙක්කම්ම, ප්‍රඥා, වීරිය, ඛන්ති, සත්‍ය, අදිට්ඨාන, මෙත්තා හා උපේක්ඛා. බලන්න: බුජ.ත්‍රි: කු.නි: බුද්ධවංශ හා චරියාපිටකය සහ The Great Chronicles of the Buddhas by Mingun Sayādaw.

[7] දහමට අනුව සසර යනු ලෝක සත්වයා, අවිද්‍යාව නිසා කෙළෙස් ඇති කරගනිමින් ඉපදී, මැරී යළි උපත ලබා සැරිසරන දීර්ඝ ගමනය. දහම අවබෝධ කර ගත් උතුමන් සියලු කෙළෙස් අහවර කර දුකින් මිදීම (නිවන ලැබීම) සසර ගමනේ අවසානයය, එනම් විමුක්තිය ලැබීමය.

[8] ඛු.නි: ධම්මපදය: බුද්ධවග්ග: 182 ගාථාව.

[9] බුජ.ත්‍රි:අංගු.නි (4) 6.2.5.1. අංගු.නි: (1) 1.13.2 සූත්‍රය ද එම කරුණ තහවුරු කරයි.

[10] බුජ.ත්‍රි: වි.පි: චුල්ලවග්ග පාලි 2: සේනාසනඛන්ධ: 27- රජගහනුවරට පැමිණි අනාථපිණ්ඩික සිටුතුමාට, රජගහ සිටුතුමා හමුවීම.

[11] බුදුන් වහන්සේගේ ජ්‍යේෂ්ඨ ගිහි දායකයෙකි, ජේතවනාරාමය මෙතුමාගේ පූජාවකි. සෝතාපන්න වූ මෙතුමා මරණ මොහොතේ සැරියුත් මහා තෙරුන් හා ආනන්ද තෙරුන් වදාළ දහම අසා අනාගාමීව, සුද්ධාවාසයක යළි උපත ලබාගති. පසුව අනාථපින්ඩික දෙව්ලෙසින්, බුදුන්වහන්සේ ට වැඳනමස්කාර කිරීමට පැමිණ ඇත. **බලන්න:** බුජ.ත්‍රි: ම.නි. (3) අනාථපිණ්ඩික ඕවාද සූත්‍රය, බුජ.ත්‍රි:සංයු.නි: (1): දේවපුත්ත සංයුත්තය: 2.2.10 අනාථපිණ්ඩික සූත්‍රය. වැඩිවිස්තර පිණිස බලන්න අපගේ වෙබ්අඩවිය: දහම් පද මාලාව

[12] බුජ.ත්‍රි: ම.නි (2) 2.5.2 සේලසූත්‍රය.

[13] දෙතිස්මහා පුරිස ලක්ෂණ: උත්තම පුරුෂයන්ට 32 ක් වූ මහා පුරිස ලක්ෂණ ඇතිබව, බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ඉන්දියානු සමාජයේ පැවති පිළි ගැනීමකි. පිටකයට අනුව එබඳු ලක්ෂණ ඇත්තේ බුදුවරුන්ට හා සක්විති රජවරුන්ට පමනය. බලන්න: දීඝ.නි: ලක්ඛණ සූත්‍රය.

[14] පළමු අවස්ථාවේම බුදුන්වහන්සේ දැක පැහැදුන සේල හා ඔහුගේ 300ක් පමණ පිරිස බුදුන් සරණ ගියෝය. අරහත්වය ලැබූ සේල රහතුන්ගේ බුදුගුණ වැණුම සුන්දරය. විස්තර පිණිස බලන්න අපගේ වෙබ්අඩවිය: දහම් පද මාලාව.

[15] මූලාශ්‍රය: බුජ.ත්‍රි: කු.නි: බුද්ධවංශ හා චරියාපිටකය.

[16] බුද්ධවංශයට අනුව ගෝතම බුදුන් 'සුමේධ තවුසා' ලෙසින් උපත ලැබූ අවධියේදී අනාගතයේ බුදුබව පතා පළමු විවරනය ලැබුවේ දීපංකර බුදුන් වහන්සේ අභිමුඛයේදීය.

[17] විස්තර පිණිස බලන්න: https://pitaka.lk/books/punyopadeshaya/39-16.html සහ මහා පිරිත් පොත.

[18] බුජ.ත්‍රි: දීඝ.නි (2 ): 1.මහාපදාන සූත්‍රය.

[19] **භද්‍රකල්පය :** පාලි: භද්දකප්ප -fortunate aeon: බුදුවරු එක නමකට වඩා පහළවන කාලසීමාව, භද්‍රකල්පය (වාසනාවන්ත කල්පය) ලෙසින් හඳුන්වයි. වර්තමාන කාලය භද්‍රකල්පය ලෙසින් හඳුන්වන්නේ බුදුවරු පස්නමක් පහළවන කාලපරිච්ඡේදයක් නිසාය. කකුසඳ, කොණාගමන, කාශ්‍යප හා ගෝතම බුදුන්වහන්සේලා සිව්නමක්(සිව්බුදුවරු) පහළවූහ. මතු පහලවන මෛත්‍රීය බුදුන්වහන්සේ පහළවන්නේ ද මේ භද්‍ර කල්පයේය. **සටහන:** සද්ධර්මාලංකාරයට අනුව: "...යම් කල්පයක පස්දෙනකුන් වහන්සේ උපදනා සේක්විනම් ඒ කල්පය බොහෝදෙනාට අභිවෘධිය කරනහෙයින් භද්‍රකල්පය නම් වේ".

[20] පච්චේකබුද්ධ (පාලි): අපදාන, මහාවස්තු, ජාතක අටුවා වන්හි පසේබුදුවරුන් පිළිබඳව විස්තරාත්මක සටහන් ඇත.

[21] ඉසිගිලි පව්ව, ඉන්දියාවේ, බිහාර් ප්‍රාන්තයේ, රාජ්ගීර් (රජගහ) නුවර වටකර පිහිටි පර්වත පහෙන් ( වේපුල්ල, වේභාර, පාන්ඩව සහ ගිජ්ජකූට) එකකි. පිටකයට අනුව බුදුන් වහන්සේ වැඩසිටි සමයේ ද මේ කඳු එවක මගධයේ පූජනීය පර්වත ලෙසින් සලකා ඇතිබව පෙනේ. ඉසිගිලි යන නමේ අරුත ලෙසින් පෙන්වා ඇත්තේ ඉසිවරු ගිල දමන පව්ව: සම්ප්‍රදායට අනුව පුරාණයේ වැඩ සිටි පසේබුදුන් වහන්සේලා උතුම් පිරිනිවීම පිණිස මේ පවවේ තිබූ ගුහාවකට ඇතුළුවූහ, එහෙත් එතුමන් වහන්සේලා නැවත පිටතට නොපැමිණි නිසා මිනිසුන් කල්පනා කර ඇත්තේ පව්ව ඉසිවරු ගිල ගත් බවයි. විස්තර පිණිස බලන්න: https://accesstoinsight.org/, Wisdom Library.

[22] විස්තර පිණිස බලන්න. බු.නි: අපදාන: පච්චේක බුද්ධ අපදාන, අංගු.නි: (1): 2 නිපාත: පුග්ගල වග්ග: 2.2.6.5. සූත්‍රය. (AN:2:People sutta). දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රයේ: පසේබුදුන් වහන්සේලා උදෙසා ස්ථූප කරවීම සහ පුදපූජා පැවැත්වීම පුණ්‍යක්‍රියාවක් බව පෙන්වා ඇත. වැඩිදුර විස්තර පිණිස:
"The Paccekabuddha: A Buddhist Ascetic"- A study of the concept of the Paccekabuddha in Pali and Commentarial Literature by Ria Kloppenborg-Wheel 305-307, BPS, 2006.

[23] බුජ.ත්‍රි: දීඝ.නි (3) චක්‍රවර්ති සිහනාද සූත්‍රය.

[24] අනාගතයේ පහළවන මෛත්‍රිය (සංස්කෘත හා සිංහල) මෙත්තෙයිය (පාලි) බුදුන් වහන්සේ පිළිබඳ සැම බොදු සම්ප්‍රදායක්ම සඳහන් කර ඇත, ගෝතම

බුදුන් වහන්සේගේ පරිනිබ්බානයෙන් පසු ව මෙතුමන් ලොව පහළවේ. එතෙක් මෛත්‍රිය බෝසතුන්, අන් සෑම බෝසතුන් ලෙසින් බුදුවීමට ආරාධනාව ලැබෙන තෙක් තුසිත දෙව්ලොව වැඩ සිටි. මෛත්‍රෙය බෝසතුන්ගේ පහළවීම පුරාණ ග්‍රන්ථ: මහාවස්තු, ලලිතවිස්තර, මුලසර්වස්තිවාද-විනය සහ දිව්‍යාවදානය වැනි කෘතීන්හි ද සඳහන් කර තිබේ. විස්තර පිණිස බලන්න: **'අනාගතවංශය: මෙත්බුදු සිරිත'**: https://pitaka.lk/books/anagatha-vanshaya/4-11.html.

25 බු.නි: බුද්ධවංශයේ: බුද්ධ ප්‍රකිරණක කාණ්ඩයේ: 17 ගාථාව.

26 මුලාශ්‍ර:1) **අනාගත කථා:** https://pitaka.lk/books/sampinditha-mahanidanaya/11.html. 2) මෛත්‍රිය බුදුන් වහන්සේ පිලිබඳ මහායාන අදහස් පිළිබඳව බලන්න:Buddha Weekly: https://buddhaweekly.com/maitreya-bodhisattva-the-future-buddha-the-face-of-love-the-loving-friend-of-all-sentient-beings/ 3) Future Buddha Maitreya: An Iconological Study: 7 by Inchang Kim: amazon. 4) Maitriya The Future Buddha – Alan Sponberg OUP (Articles): https://archive.org/details/maitreyathefuturebuddhaalansponbergouparticles.

27 බලන්න: බුජ.ත්‍රි:සංයු.නි: අනමත්තග්ග සංයුත්ත: 3.1.5 පර්වත සූත්‍රය. එම උපමාව සමග බුදුන් වහන්සේ වෙනත් උපමා පෙන්වා කල්පයක දිග පැවසීම අසීරු බව වදාළහ.

28 බලන්න: බුජ.ත්‍රි:ම.නි(3) 3.3.9 බාලපණ්ඩිත සූත්‍රය, බුජ.ත්‍රි:සංයු.නි.( 5-2): සච්චසංයුත්ත: 12.5.7 -8 ඡිග්ගල සූත්‍රය.

29 විස්තර පිණිස බලන්න: 'සීලයේ අනුසස්' පූජ්‍ය විතාරන්දෙනියේ මේධානන්ද හිමි: බුදුසරණ අන්තර්ජාල කළාපය- 2017, පෙබරවාරි 26. https://www.budusarana.lk/budusarana/2017/02/26/tmp.asp?ID=vision03.

30 බුදුන් වහන්සේගේ ඉගැන්වීමේ අවසාන ඉලක්කය නිවන (නිබ්බාන) ය වේ. සසර දුක නැතිකර, යළි උපත අවසාන කර, සියලු කෙළෙස්—ලෝභ, දෝෂ, මෝහ —ගලවා සුවපත් වීම නිවනය. ප්‍රඥාවන්තයෝ, තෙල් සිඳුන පහනේ දැල්ල නිමියන ලෙසින් නිවන් සුවය ලබාගනී- 'නිබ්බන්ති ධීරා යථා යං පදීපෝ'. බලන්න: : Introduction to Majjima Nikaya by Bhikkhu Bodhi සහ මජ්ජිම නිකාය: කේවඩ්ඩ සූත්‍රය.

31 උපුටා ගැනීම: බුජ.ත්‍රි:අංගු.නි: (1): සඥාපනය. මේතෙරුන් වහන්සේ බුජ.ත්‍රි: අංගුත්තරනිකායේ සම්පාදකයය, උන්වහන්සේ, අහංගම, විද්‍යාවන්ද්‍ර පිරිවෙනේ නායක ධුරය හෙබවිය.

32 බුදුන් වහන්සේ සම්බෝධිය ලබා, පස්වග තවුසන්ට දේශනාකළ පළමු සූත්‍රය: බලන්න: වින.පි: මහාවග්ග:1 :22 සහ සංයු.නි: (5-2): සච්චසංයුත්ත: 12.2.1 ධම්මචක්කප්පවත්තන සූත්‍රය (SN11: 1).

33 සුභද්‍ර පරිබ්‍රාජක බුදුන් වහන්සේ ගේ අවසාන ශ්‍රාවකයාය. බලන්න: දීඝ.නි: මහාපරිනිබ්බාන සූත්‍රය.

34 බුජ.ත්‍රි: අංගු:නි (1) එකනිපාත: 1.13.1 -25 සූත්‍ර (AN1:170).

35 බුජ.ත්‍රි: අංගු:නි (1) එකනිපාත: 1.13 – 14-25 සූත්‍ර.

36 බුජ.ත්‍රි: (2) : 5 ජනවසභ සූත්‍රය. පිටකයට අනුව බුදුන් වහන්ස්ගේ බැතිමත් ශ්‍රාවකයෙක් වූ බිම්බිසාර රජ, සොතාපන්නව, මරණින් මතු චාතුර්මහා රාජකීය දෙව්ලොව, ජනවසභ නම් දෙවියෙක් ලෙසින් යළි උපත ලැබිය. විස්තර: දිඝ.නි; මහාපරිනිබ්බාන සූත්‍රයේ පෙන්වා ඇත.

37 දහමට අනුව 'දේවලෝක' සුගතියකි, යහපත් කම්ම නිසා උපත ලබන තැනකි. කාමවර දේවලොක 6කි. විස්තර පිණිස බලන්න: අපගේ වෙබ්අඩවිය: : දහම් පද මාලාව.

38 පාපකම්ම විපාක නිසා අසුර නිකායේ යළි උපත ලබන සත්වයයෝ අසුරයන්ය. ඔවුන් දෙවියන්ට විරුද්ධව ක්‍රියා කරති. මෙය දුගතියකි. බලන්න: අපගේ වෙබ්අඩවිය: : දහම් පද මාලාව.

39 බුජ.ත්‍රි: (2) : 6 මහගොවින්ද සූත්‍රය.

40 බුජ.ත්‍රි: සුත්තනිපාත: 3-11 නාලක සූත්‍රය.

41 අසිත තවුසා: පුරාණ දඹදිව වැඩසිටි ප්‍රසිද්ධ ඉසිවරයෙකි. මෙතුමා ළදරු සිදුහත් කුමරු ගේ ලක්ෂණ පිරික්සා, කුමරු නියතලේසින්ම බුදුබව ලබන බව පැවසිය. මේ සංස්කරණයේ 3 න කොටසේ මේ සිදුවීම විස්තර කර ඇත.

42 සක්දෙවිඳු-දේවානමින්ද : තව්තිසා හා චාතුර්මහාරාජකීය දේව ලෝකයන්ට අධිපතිය, බුදුන් වහන්සේගේ සොතාපන්න දේව ශ්‍රාවකයෙකි. බලන්න: සංයු.නි: සක්ක සංයුත්ත සහ අපගේ වෙබ්අඩවිය: : දහම් පද මාලාව.

43 බලන්න: 1. The Great Chronicles of the Buddhas by Mingun Sayādaw 2. බු.නි: බුද්ධවංශ.

44 තුසිත දෙව්ලොව, කාමාවාචර දේව ලෝක 6 න් එකකි. එහි එක් රැයක්= මිනිස් ලෝකයේ දින 400 කි. තුසිත දේවියන් දේවවර්ෂ 1000 පමණ දීර්ඝ ආයුෂ විඳි. සියලු බෝසතුන් බුදුවීමට පෙර මේ දේවලෝකයේ උපත ලබා, ඉන්පසු මිනිස්ලොව අවසාන උපත ලබති. විස්තර පිණිස බලන්න: දහම් පද මාලාව.

45 බුජ.ත්‍රි: ම.නි (3): 3.3.3 අච්ඡරියඅද්භූත සූත්‍රය (MN:123).

46 බලන්න: 1. Chapter 1: The Great Chronicles of Buddhas by Venerable Mingun Sayadaw. 2. "සම්බුදු සසුනේ චිර පැවැත්මට උපකාර කරන දෙවිවරු": සම්පාදනය: පුජ්‍ය ගලිගමුවේ ඤාණදීප හිමි: බුදුසරණ අන්තර්ජාල කලාපය: 2017, නොවැම්බර් 17 දා.
https://www.budusarana.lk/budusarana/2017/11/17/tmp.asp?ID=vision12

47 විකිපීඩියා: ඉන්දියාවේ කල්කටානුවර කෞතුකාගාරයෙ ඇති ක්‍රි.ව. 2 නී සියවසේ අමරාවතී ගල් කැටයමේ පිළිරුවකි.
https://commons.wikimedia.org/wiki/File:Buddha_Preaching_in_Tushita_Heaven._Amaravati,_Satavahana_period,_2d_century_AD._Indian_Museum,_Calcutta.jpg

[48] බලන්න: 1. ලිපිය: 'පස්මහ බැලුම් බැලුවේ ඇයි?' සම්පාදක: පූජ්‍ය විලේගොඩ අරියදේව හිමි, රුහුණු විශ්ව විද්‍යාලය. බුදුසරණ: 2017, මැයි මස: https://www.budusarana.lk/budusarana/2017/05/10/. 2. https://pitaka.lk/books/pansiya-panas-jathaka/1-4-1.html.

[49] බලන්න: මයුරපාද පරිවේනාධිපති බුද්ධ පුත්‍ර හිමියන් රචිත පූජාවලිය.

[50] බලන්න: The Great Chronicles of the Buddhas by Mingun Sayādaw සහ ශ්‍රීලංකා පුවත්පත: Sri Lanka Daily Newspaper: "Significance of Esala Poya: Full Moon of Prophecy": July 10, 2025.

[51] ජම්බුදිපයේ 'මධ්‍ය ප්‍රදේශය (පාලි: මජ්ඣිම දේස) යනු බුදුන් වහන්සේ උපත ලැබූ, ජීවත් වූ සහ ඉගැන්වීම් සිදු කළ ඉන්දියානු උප මහද්වීපයේ මධ්‍යම භූගෝලීය ප්‍රදේශයයි. මෙම කලාපය උත්තර ප්‍රදේශය, බිහාර් සහ නේපාලයේ කොටස් ආවරණය කරමින් නූතන ගංගා නම් නිම්නයට අනුරූපවේ. විස්තර පිණිස බලන්න: buddhanet.net

[52] කපිලවස්තු නුවර (කිඹුල්වත්නුවර), පුරාණයේ ශාක්‍යයන් ගේ අගනුවර, බුදුන් වහන්සේ සිදුහත් කුමරු ලෙසින් වයස අවුරුදු 1-29 දක්වා ජීවත්වූ නුවරය.3 න කාණ්ඩයේ මෙම නුවර පිලිබඳ විස්තරයක් දක්වා ඇත.

[53] සුද්ධෝදන ශාක්‍ය රජ සහ මහමායා දේවිය බුදුන් වහන්සේගේ දෙමාපියන්ය.

[54] ඇසළ පුර පසළොස්වක පෝය (ඇසළ පෝය- ජූලි-අගෝස්තු කාලය ) බෞද්ධ ඉතිහාසයේ ඉතාමත් වැදගත් සිදුවීම් බහුල දිනයකි. සිදුහත් කුමරු පිළිසිඳ ගැනීම, මහාභිනිෂ්ක්‍රමණය, ප්‍රථම ධර්ම දේශනාව (ධම්මචක්කප්පවත්තන සූත්‍රය), රාහුල කුමරුගේ උපත, යමාමහ පෙළහර සහ වස් විසීම ආරම්භ කිරීම වැනි වැදගත් සිදුවීම් ගණනාවක් ඇසළ පෝය දිනට යෙදේ. බලන්න: Dictionary of Pāli Proper Names, G.P. Malalasekera සහ https://pitaka.lk/books/pohoya-varnanava/7.html

[55] බුජ.ත්‍රි: ම.නි (3): 3.3.3 අච්ඡරියඅද්භූත සූත්‍රය (MN:123).

[56] සම්ප්‍රදායට අනුව සතරවරම් දෙවියෝ මෙලොව සිව්දිසාව පාලනය කරණ බව ද, සක්දෙවිඳුගේ අනසක අනුව බුදුදහම ලෝකයේ ආරක්ෂා කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. දීඝ:නී: මහාසමය සූත්‍රයෙ සිව්මහා දෙව්වරු මෙසේ නම් කර ඇත: ධෘතරාෂ්ට්‍ර , විරූඪ , විරූපාක්ෂ හා වෛශ්‍රවණ.

[57] හිමාලය පර්වතයෙහි පිහිටා ඇතැයි සඳහන් වන සප්තමහාතටාකයන් අතුරෙන් ප්‍රධාන විල අනවතප්ත (අනොතත්ත) නම් වෙයි. සුමඞ්ගලවිලාසිනී ආදි අට්ඨකථාවල ද බුත්සරණ ආදි සිංහල පොත්වල ද සඳහන් වන විස්තරවලට අනුව සූර්‍ය රශ්මියෙන් නොතැවෙන ජලය ඇති හෙයින් මේ විල අනවතප්ත නම් විය, විස්තර පිණිස බලන්න: සිංහල විශ්වකෝෂය: http://encyclopedia.gov.lk/si_encyclopedia/index.php.

[58] බලන්න: "මහමායා දේවිය දුටු සිහිනය", පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ සිරිසමන් විජේතුංග විසිනි: බුදුසරන අන්තර්ජාල කලාපය: ජනවාරි 16, 2016.

https://www.budusarana.lk/budusarana/2016/01/16/tmp.asp?ID=fea03 . පූජාවලියේ ද එම සිදුවීම විචිත්‍රව දක්වා ඇත.

[59] නේපාල චිත්‍ර ශිල්පී මානික්මන් චිත්‍රක : Painting by Manikman Chitraka : MON: Museum of Nepali Art - **https://www.mona.com.np/artist/v/manikman-chitrakar .**

[60] බලන්න:The Great Chronicles of Buddhas by Venerable Mingun Sayadaw සහ පූජාවලිය.

[61] The *Lalitavistara Sūtra* is a Sanskrit Mahayana Buddhist sutra that tells the story of Gautama Buddha (බුදුන් වහන්සේගේ ජීවිතය විස්තර කරණ මහායාන පැරණි සංස්කෘත ග්‍රන්ථයකි. බලන්න: විකිපීඩියා).

[62] ජිනචරිතය: බුදුන් වහන්සේගේ ජීවිතය: පූජ්‍ය මේධංකර හිමියන් විසින් රචිතය. බලන්න:PTS: Jinacarita: Poem on the life of the Buddha concentrating on his final existence. Written in Sri Lanka. (13th century C.E.) edited by W.H.D. Rouse.

[63] මහා ප්‍රජාපතී තේරී අපදානයේ දී , දේවදහ නුවර ඇයගේ සහ සොහොයුරියවූ මහමායා දේවියගේ උපන්බිම බව සටහන් කර ඇත.

[64] ශාක්‍ය ජනපදය හිමාල කඳු පාමුලට දකුණින් සහ ඉන්දු-ගංගා තැනිතලාවට උතුරින් පිහිටි ටෙරායි ප්‍රදේශයේ පිහිටියේය. බටහිරින් සහ දකුණින් ඔවුන්ගේ අසල්වැසියන් වූයේ කෝසල රාජධානියයි.බලන්න: විකිපීඩියා.

[65] බුජ.මනි: (3) 3.1.1. දේවදහ සූත්‍රය, එසේම සංයුත්තනිකායේ, බුජ.සංයු.නි: (4) 1.1.41. දේවදහ සූත්‍රය ද දේශනා කර ඇත්තේද දේවදහ නුවරය.

[66] වර්තමාන නේපාල රජයේ, ලුම්බිණි පළාතේ රුපෙන්දී දිස්ත්‍රිකකය පිහිටා ඇත, විස්තර පිණිස බලන්න: Lumbini Development Trust.

[67] රෝහිනී නදිය: ශාක්‍ය ජනපදය හා කෝලිය රජය අතර පිහිටි නදියක් බව සම්ප්‍රදාය විස්තර කර ඇත, විස්තර පිණිස බලන්න: Dictionary of Pāli Proper Names by G.P. Malalasekera සහ Wikipedia.

[68] පුරාණ කෝලිය අගනුවර ලෙස හඳුනාගෙන ඇති දේවදහහ ස්ථානයේ ක්‍රමානුකූල, නවීන පුරාවිද්‍යාත්මක කැණීම් 2011 දී ලුම්බිණි සංවර්ධන භාරය සහ නේපාලයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. විස්තර පිණිස බලන්න: 1) Important Archaeological Sites of Devadaha Village by Ram Bahadur Kunwar 2) Archaeology of Buddhism: Recent Discoveries within the Koliya Republican Region of Nepal by Prakash Darnal.

[69] ගුගුල් සිතියම.

[70] විස්තර පිණිස බලන්න: 1) Itihaas: https://itihaas.ai/en/tradeRoutes/uttarapatha, 2) Dharma Wheel: https://www.dharmawheel.net/viewtopic.php?t=44899 3) Wikipedia: https://en.wikipedia.org/wiki/Grand_Trunk_Road.

71 පුරාණයේ කපිලවස්තු සිට දේවදහ, මල්ල රටේ රාම්නගරය හරහා විහිදීගිය වෙළඳ මාර්ගයක් විය.බලන්න: : Archaeology of Buddhism: Recent Discoveries within the Koliya Republican Region of Nepal by Prakash Darnal.

72 මෙම සිතියම සකස් කර ඇත්තේ Facebook පිටුවක දක්වා ඇති සිතියමක් ආශ්‍රය කරගෙනය. මූලාශ්‍රය: **Monidipa Bose Dey** Face book page

73 විස්තර පිණිස බලන්න: 1) Itihaas: https://itihaas.ai/en/tradeRoutes/uttarapatha, 2) Dharma Wheel: https://www.dharmawheel.net/viewtopic.php?t=44899 3) Wikipedia: https://en.wikipedia.org/wiki/Grand_Trunk_Road.

74 සරල සිංහල බසින් අප සකස්කල මෙම උපුටා ගැනීමේ මූලාශ්‍රය: https://ancient-buddhist-texts.net/English-Texts/Great-Chronicles/Great-Chronicles.pdf

75 ලලිත විස්තරය, ජාතක නිදාන කතා, දිව්‍යවදන ආදී පැරණි ග්‍රන්ථයන්හි ලුම්බිණි උයන/ වනය විචිත්‍ර ලෙසින් වර්ණනා කර ඇත.

76 විකිමීඩියා: Kushan dynasty, late 2nd to early 3rd century CE. Freer Gallery of Art, Washington, D.C.
https://commons.wikimedia.org/wiki/File:Four_Scenes_from_the_Life_of_the_Buddha_.

77 බුජ.ත්‍රි:සුත්තනිපාත: 3:11 නාලක සූත්‍රය.

78 බුජ.ත්‍රි:ම.නි (3): 3.3.3 ආචාරියා අද්භූත සූත්‍රය.

79 බුජ.ත්‍රි:ම.නි (3): 3.3.3 ආචාරියා අද්භූත සූත්‍රය.

80 චිත්‍රය: එම්. සාර්ලිස් ; ශ්‍රී ලංකාවේ විහාර බිතුසිතුවම් කලාව විප්ලවීය වෙනසකට ලක්කරන්න දායක වුණ ප්‍රමුඛතම චිත්‍ර ශිල්පියෙක් විදිහට එම්.
සාර්ලිස්ව හඳුන්වා දෙන්න පුළුවන්. අද පවා සාර්ලිස් ඇඳපු දේවාරාධනය, නියත විවරණය, මහමායා දේවිය දුටු සිහිනය, සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය වැනි චිත්‍ර වලින් බොහෝ බෞද්ධ නිවෙස්වල බිත්ති සැරසෙනවා. ඒ වගේම බෞද්ධ නිවෙස්වල අනිවාර්යයෙන්ම දකින්න ලැබෙන සීවලී හාමුදුරුවන්ගේ පින්තූරයත් සාර්ලිස් මහතාගේ නිර්මාණයක්. https://www.lifie.lk/2020/08/02/famous-Sri-Lankan-painters/

81 ශ්‍රීමත් එඩ්වින් ආර්නෝල්ඩ් විසින් රචිත ‘Light of Asia’ (පෙරදිග පහන) නිසැකයෙන්ම සුවිශේෂ කෘතියකි, එසේ වන්නේ දිර්ඝ කාලීන වූ බෞද්ධ ඉතිහාසයෙහි බුදුන් වහන්සේ ගැන ඉංගිරිසි බසින් ලියවුන එකම ස්වත්‍රන්තික කාව්‍ය එය නිසාය. බලන්න: පෙරදිග පහන: පූජ්‍ය වේරගොඩ සාරදමහා තෙර: පරිවර්තනය: හඳුජී මහින්ද ජයතිලක, PBS: Wheel no29, 1980.

82 ක්‍රි.ව: 1 සියවසේ ඉන්දියාවේ ජීවත්වූ අශ්වඝොෂ, කණිෂ් රජතුමාගේ ආධ්‍යාත්මික උපදේශක ලෙසින් කටයුතු කර ඇත. ඔහු විසින් රචිත බුද්ධ චරිතය නමැති සංස්කෘත කවිපෙළ ආශ්‍රිත කර ගෙන සිංහල අනුවාදය සකස්කලේ සංස්කාරකය. බලන්න: Translations of Aśvaghoṣa's Buddhacarita by Mike Cross.



## ලුම්බිණියේ සිට කුසිනාරාවට: උත්තම බුදු උපත

## (පළමු කාණ්ඩය)

ලොව පහළ වූ අසිරිමත් මෙන්ම අසමසම ශාස්තෘවරයාණන් වහන්සේ වන ගෞතම බුදු පියාණන් වහන්සේගේ උ ත්තම උපත, හුදෙක් අහඹු සිදුවීමක් නොව දීඝ සංසාරයක අප්‍රමාණ පාරමිතාවන් සම්පූර්ණ කළ බෝධිසත්වයන් වහන්සේ නමකගේ අත්‍යුදාර ප්‍රතිඵලයයි. කතුවරයා විසින් සිදුකළ සුවිශේෂී පර්යේෂණාත්මක අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම ග්‍රන්ථය, බුදු උපතේ ඓතිහාසික සත්‍යතාව සහ විශ්වසනීයත්වය මැනවින් තහවුරු කරයි.

පූජනීය ත්‍රිපිටක පාඨයන් මූලික කරගනිමින්, සාම්ප්‍රදායික බෞද්ධ සාහිත්‍යය, ඉතිහාසය සහ නූතන පුරාවිද්‍යාත්මක සාක්ෂි ඉතා සියුම් ලෙස ගළපමින් සිදුකර ඇති මෙම විශිෂ්ට පර්යේෂණය, බුදු උපතක ඇති අතිශය දුර්ලභ බව, තුසිත දෙව්ලොවින් චුතව මනුලොව පිළිසිඳ ගැනීම, පස්මහා බැලුම්, මහාමායා දේවිය දුටු අසිරිමත් සිහිනය මෙන්ම මනරම් ලුම්බිණි සල් උයනේදී සිදුවූ උත්තම පුරුෂෝත්පත්තිය, සත් පියවර සහ සිංහ නාදය පිළිබඳ පුවත් පාඨකයා හමුවේ තබන්නේ අතිශය විද්‍යාත්මක හා ශාස්ත්‍රීය පදනමක පිහිටවමිනි.

අපමණ කරුණාවෙන් හා දයාවෙන් සසර දුකින් එතෙර වීමට මඟ පෙන්වූ ඒ මහා ප්‍රඥාවන්තයාණන් වහන්සේගේ ජීවන ප්‍රවෘත්තිය නවමු මානයකින් විවරණය කරන මෙම කෘතිය, සත්‍ය ගවේෂී ඕනෑම කියවන්නෙකුගේ හදවත ශ්‍රද්ධාවෙන්, ප්‍රඥාවෙන් හා අකම්පිත විශ්වාසයකින් ඔකඳ කරවන අගනා ආධ්‍යාත්මික මෙන්ම ශාස්ත්‍රීය මාර්ගෝපදේශකයෙකි.